# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1872/33 - 2014 ජූලි මස 25 වැනි සිකුරාදා - 2014.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත**

4(2) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකධිකාරී ආයතනය (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, ආයතනය විසින් මේ සමග පළකර ඇති ලාභ-සඳහා-නොවන සංවිධාන සඳහා (රාජ්‍ය - නොවන සංවිධාන ඇතුලුව) වන නිර්දේශිත පරිචය ප්‍රකාශනය සම්මත කර ඇති අතර, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ අරමුණු සඳහා මෙම ප්‍රමිතීන් වර්ෂ දෙදහස් දොළහේ ජනවාරි මස පළමුවැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක වේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2014 ජූලි මස 25 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දී ය.

**ලාභ - සඳහා - නොවන සංවිධාන**
**සඳහා වන**

**නිර්දේශිත ශ්‍රී ලංකා**

**පරිචය ප්‍රකාශනය**
(රාජ්‍ය නොවන - සංවිධාන ඇතුළුව)
(ශ්‍රීලංනිපප්‍ර - ලාසනොස [රානොස ඇතුලුව])

පටුන


1. ප්‍රස්තාවනාව

2. හැඳින්වීම

2.1 පොදු

2.2 නෛතික ආකෘතිමය රාමුව

3. මූල්‍ය වාර්තාකරණය සඳහා සංකල්පිත ආකෘතිමය රාමුව

3.1 ලාසනොසවලට සම්බන්ධිත ප්‍රධාන නිර්වචනයන් සහ සංකල්ප

3.1.1 ලාසනොසයක නිර්වචනය

3.1.2 පරිත්‍යාග/දායකවීම්, ප්‍රදාන, සාමාජික මුදල්

3.1.3 පරිත්‍යාග ගිවිසුම්

3.1.4 සීමා කරන ලද අරමුදල්

3.1.5 සීමා නොකරන ලද අරමුදල්

3.1.6 සමුච්චිත අරමුදල

3.1.7 පාලක මණ්ඩලය

3.2 පරිශීලකයන් සහ ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාවයන්

3.3 ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ගතිලක්ෂණ

3.4 ප්‍රයෝජනවත් මූල්‍ය වාර්තාකරණය මත පිරිවැය සංරෝධක

3.5 පාදක කරගත් උපකල්පන

4. ලාසනොස නිශ්චිත විධිවිධාන

5. බලාත්මක දිනය

පරිශිෂ්ඨය - නිදර්ශනාත්මක මූල්‍ය ප්‍රකාශන ව්‍යූහය

1. *ප්‍රස්තාවනාව*

1.1 ලාසනොස සඳහා ශ්‍රීලංනිපප්‍රය පිහිටුවීමේ ශ්‍රීලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රීලංකාවග) පරමාර්ථය වනුයේ ලාසනොස සඳහා මූල්‍ය වාර්තාකරණයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා වගකිවයුතු අයට සහායවීමට සහ එමගින් මූල්‍ය වාර්තා පරිශීලනය කරන්නන් හට ප්‍රමාණවත් තොරතුරු ලබාදීමය. ගිණුම්කරණ පරිචය සහ ඉදිරිපත් කිරීම පිළිබඳව ලානොස අතර පවතින විවිධත්වය /අසමානකම් අඩුකිරීමද මෙහි අභිප්‍රාය වේ. ඔවුන්ගේ සංවිධානවල පවත්නා තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ මතයක් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශනවලින් ලබාදීම පිණිස සියලුම ලාසනොස මෙම ශ්‍රීලනිපප්‍රය අනුගමනය කිරීම නිර්දේශ කෙරේ.

1.2 2012 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිති/අජාමූවාප්‍ර (IFRS) වලට සම්පූර්ණයෙන්ම ඒකරාශී වීමත් සමග, ලාසනොස සඳහා 2006 අප්‍රේල් 1 දින බලපැවැත් වූ. 2005 දී නිකුත් කළ දනට පවතින ශ්‍රීලනිපප්‍රයන්, 2006 දී ව්‍යවහාර වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රීලවිප්‍රයන්) මත පදනම් වී ඇති නිසා, සංශෝධනය කිරීම අවශ්‍ය වේ. එබැවින් අජාමූවාප්‍ර (IFRS) මත පදනම්වූ නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව යමින් පවතින ශ්‍රීලනිපප්‍රයය සංශෝධනය කිරීමට ශ්‍රී ලංකා වග තීරණය කරන ලදී.

1.3 මෙම ශ්‍රීලනිපප්‍රය ඒවායේ විශාලත්වය හෝ සංකීර්ණභාවය නොසලකා ශ්‍රී ලංකාවේ මෙහෙයුම් කරන සියලු ලාසනොස සඳහා ව්‍යවහාර කිරීමට අපේක්ෂා කෙරේ.

1.4 සත්‍ය හා සාධාරණ මතයක් ලබාදීමට, උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා වනපදනම එය සලසයි.

1.5 ලාසනොස ඔවුනට අදාළවන එම ප්‍රමිතයන් සමග පමණක් අනුකූල විය යුතුය. ස්වකීය ලාසනොසයකට ඔවුන්ගේ ක්‍රියාකාරකම් වලට අදාළ නොවනකරුණු පිළිබඳව කටයුතු කරන ප්‍රමිත පිළිබඳව සුරක්ෂිතව නොසලකා හැරිය නොහැක.

1.6 සියලුම ලාසනොස ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලින් (SLFRS - ආකෘතිමය රාමුව) නියම කර ඇති අවශ්‍යතාවයන් සමග අනුකූලවීම අවශ්‍ය කෙරේ (SLFRS ආකෘතිමය රාමුව සම්පූර්ණ SLFRSs (නිල වශයෙන් ප්‍රකාශයට පත්කළ IFRIC සහ SIC ඇතුලුව විස්තීර්ණ SLFRS කට්ටලයකින්) වලින් සහ කුමපආ සඳහා වූ SLFRS (කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය) වලින් සමන්විත වේ. පොදු වගකිවයුතු භාවයකින් යුත්සියලුම ලාසනොස සම්පූර්ණ SLFRSs සමග අනුකූළ විය යුතුය.

1.7 අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කට්ටල හා සමග පද සම්බන්ධය සහිතව කියවිය යුතු ලාසනොස සඳහා වන අතිරේක නිශ්චිත විධිවිධාන මෙම ශ්‍රීලනිපප්‍රයේ 4 වන කොටසේ දී ඇත.

1.8 මෙම ශ්‍රීලනිපප්‍රයේ ඇතුළත්ව ඇති සෑම විධිවිධානයක්ම සැලකිල්ලට ගතයුත්තේ එහි අදාළත්වයේ සම්බන්ධය සහිතව සහ යම් විශේෂ ලාසනොස එකකට ප්‍රමාණාත්මක වන්නේ කුමක්ද යන්න අනුවය.

*********

2. *හැඳින්වීම*

2.1 **පොදු**

2.1.1 මුලු ලොවපුරාම, ලාභ සඳහා නොවන සංවිධාන (ලාසනොස) ඔවුන් මෙහෙයුම් කරන රටවල සාමාජීය ආර්ථික ක්‍රියාවලියට ඉතා වැදගත් කාර්යභාරයක (භූමිකාවක) යෙදේ. මෙය සංවර්ධනය වෙමින් පවතින රටවලට මෙන්මසංවර්ධනය වූ රටවලට එකලෙස සත්‍ය වේ. ඒ අනුව ශ්‍රීලංකාවේ ලාසනොස ද බැහැරලීම කළ නොහැක. මෙම සංවිධාන සාමාජයීය සහ දේශපාලන යන විෂය ක්ෂේත්‍ර දෙකේම වැදගත් කාර්යභාරයක් ඉටුකරන ක්‍රියාකාරීන් වේ.

2.1.2 ලාසනොසයකින් කෙරෙන ඒ හා සමාන මුල්ම ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාවේ මතුවූයේ 19 වන ශත වර්ෂය අග භාගයේ බ්‍රිතාන්‍ය වැඩ වසම් කාල පරිච්ඡේදය තුළදීය. වසර 100කට පමණ පසු රටේ මහා පරිමාණ වෙනස්වීම් සමග ශ්‍රී ලංකාවේ ලාසනොස වල නියෝජනය සැලකිය යුතු අන්දමේ ව්‍යාප්තියක් දක්නට ලැබිණ. 1970 අග භාගයේදී ආර්ථිකය ලිහිල් කිරීමත් සහ ඊට පසුව විදේශ විනිමය රෙගුලාසි, වෙළඳ සහ සංචාරක සීමාවන් ලිහිල් කිරීමත් සමග විදේශීය ලාසනොස වල සුවිශේෂ වැඩිවීමක් මතුවිය. විදේශීය සම්පත්වලින් ලබාදෙන සහාය ගලා ඒම වැඩිවීම ප්‍රජාවගේ ව්‍යාප්තිය, ග්‍රාමීය සංවර්ධනය සමග ලාසනොස වල අතිරේක ප්‍රගුණනය වීමක් රට තුළ නිරීක්ෂණය විය.

2.2 **නෛතික ආකෘතිමය රාමුව**

2.2.1 මෙම සංවිධාන හරහා ගලාඑන අරමුදල් වල විශාලත්වය නිසා ඒවා පිළිබඳ පසු විපරම් කිරීම, අධීක්ෂණය සහ ගිණුම් කටයුතුභාවය පිළිබඳ වන භාෂිතය පැත්තෙන් ගත්කල සැලකිය යුතු අන්දමේ වගකීමක් ඇති කෙරේ. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ පාරදෘශ්‍යතාවය වැදගත් ප්‍රස්තුතය බවට පත්වේ. මෙම සංවිධාන වෙත, ගිණුම්කරණය සහ වාර්තාකරණය ඇතුළුව ඔවුන්ගේ කාර්යයන් කෙසේ පවත්වාගෙන යා යුතුද යන්න පිළිබඳව පැහැදිලි මෙහෙයුම් නිර්ණායක ලබාදීම අවශ්‍ය වේ. සමස්ථයම ලෙස ගත්කළ සමාජය තුල මෙම සංවිධාන කටයුතු කරන වැදගත් භූමිකාව සලකා බැලීමේදී විස්තීර්ණ රෙගුලාසි අත්‍යවශ්‍යයෙන්ම ඵලදායී නොවීමටත් "ඕනෑවට වැඩි" රෙගුලාසි, "ඕනෑමට අඩු රෙගුලාසි" හා සමාන ලෙස නරක අතට හැරීමටද ඉඩ තිබේය යන්න ද කෙසේ වෙතත් පිළිගෙන ඇත. ලාභ සඳහා නොවන සංවිධාන සඳහා වන නිර්දේශිත පරිචය (රාජ්‍ය නොවන සංවිධාන ඇතුළත්ව)ප්‍රකාශනය සැලසුම් කර ඇත්තේ මෙම පුළුල් ආකෘතිමය රාමුව ඇතුළතය.

2.2.2 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත මගින් ("ස්සසේස පනත") රාජ්‍ය ප්‍රදානයන් ලැබෙන හෝ පිටරට වාසි සේවක මණ්ඩලවලට වීසා අවශ්‍ය කරන සියලු සංවිධාන මෙම පනත යටතේ ලියාපදිංචි විය යුතුය. 2007 අංක 07 දරන සමාගම් පණත යටතේ සීමිත වගකීම් සහිත සමාගම් ලෙසද, 1917 අංක 17 දරන භාර ආඥා පනත යටතේ භාර ලෙස ද 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත යටතේ පුණ්‍යආයතන ලෙසද, 1963 අංක 4 දරක දේශීය ආදායම්පනත හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ 1949 අංක 55 දරන අන්‍යොන්‍යාධාර සකසුරුවම් සමිති පනත යටතේ අනුමත පුණ්‍ය ආයතන ලෙස ලාසනොස වලට ලියාපදිංචි විය හැකිය. ලාසනොසයක්පාර්ලිමේන්තු පනතක් මගින්ද පිහිටුවිය හැකිය.

2.2.3 1998 අංක 8 දරන ස්වේච්ඡා සමාජ සේවා (ලියාපදිංචිය සහ අධීක්ෂණය) (සංශෝධනය) පනත ස්සසේස පනත සංශෝධනය කරන ලද්දකි. සංවිධානයක වංචාවක් හෝ සාවද්‍ය පරිහරණ සිද්ධියකදී සංවිධානයේ කාර්යයන් පරිපාලනය කිරීමට අතුරු කළමනකරණ මණ්ඩලයක් පත්කිරීමට මෙම සංශෝධන මගින් ඉඩ ලැබේ.

2.2.4 සියලුම රානොස, ජාතික රානොස ලේකම් කාර්යාලයේ යළි ලියාපදිංචි වන ලෙස කැඳවීමක් සහ ඔවුන්ගේ අරමුදල්කරන ප්‍රභව, වාර්ෂික වියදම් සහ වාර්ෂික අයවැය ලේඛණ ප්‍රකාශ කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා, පසුව 1999 වර්ෂයේදී ජනාධිපති චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. යළි ලියාපදිංචි වීම සඳහා පූර්වාවශ්‍යයකට ආරක්ෂක විදේශ කටයුතු, සැලසුම් ක්‍රියාත්මක විෂයන් භාර අමාත්‍යාංශවලින් සහ අදාළ රේඛීය අමාත්‍යාංශයෙන් ලබාගන්නා බාධා ඉවත් කිරීමක්ද ඇතුළත් වේ. එක දිස්ත්‍රික්කයක හෝ ප්‍රාදේශීය මට්ටම්වල ක්‍රියාකාරකම් පවත්වාගෙන යන අදාළ දිස්ත්‍රික්කයේ හෝ ප්‍රාදේශීය ලේකම් සමගද ලියාපදිංචි විය යුතුය.

3. **මූල්‍ය වාර්තාකරණය සඳහා සංකල්පමය ආකෘතිමය රාමුව**

3.1 **ලාසනොස සම්බන්ධිත ප්‍රධාන නිර්වචනයන් සහ සංකල්පයන්**

*3.1.1 ලාසනොස නිර්වචනය (ලාභ සඳහා නොවන සංවිධාන)*

I. ලාභ සඳහා නොවන සංවිධානයක් යනු පොදු මහජනතාවගේ යහපත සඳහා ව්‍යාපාර කටයුතු කරන කොටස් හිමියන් නොමැති සහ ලාභ චේතනාවක් නොමැති සංස්ථාවක් හෝ සංගමයකි. ඒවා බොහෝවිට "සංවර්ධන සංවිධාන" "පුද්ගලික ස්වේච්ඡා සංවිධාන", "සිවිල් සමාජයේ සංවිධාන", "රාජ්‍ය-නොවන සංවිධාන", "ලාභ සඳහා නොවන සංවිධාන", "පුණ්‍ය ආයතන" සහ වෙනත් ඒ හා සමාන භාෂිතයන්ගෙන්ද හඳුන්වනු ලැබේ.

II. මෙම ශ්‍රීලනිපප්‍ර හට ගන්වා ඇත්තේ සිවිල් සමාජය යන වැකිකඩ සඳහා ලෝක බැංකුව විසින් සපයා ඇති "පහත සඳහන් නිර්වචනය එහි අන්තර්ගතයන්ට ව්‍යවහාර කිරීමෙනි. ලෝක බැංකුව සිවිල් සමාජය යන පදය භාවිතා කරන්නේ ආචාර ධර්ම, සංස්කෘතික, දේශපාලනික, විද්‍යාත්මක, ආගමික හෝ මානව හිතවාදී සලකා බැලීම් මත පදනම් වූ තම සාමාජිකයන්ගේ හෝ වෙනත් අයගේ උනන්දුවත්, සාරධර්මත් ප්‍රකාශිත කෙරෙන ආකාරයට තමන් පවතින බව ජන ජීවිතය කෙරෙහි දනෙන්නට හරින රාජ්‍ය නොවන හා ලාභ සඳහා නොවන පුළුල් පරාසයක සංවිධානවලට යොමුවීමටය."

එමනිසා සිවිල් සමාජීය සංවිධාන (සි.ස.සං) පුළුල් පෙලක සංවිධාන කෙරෙහි යොමු කිරීමක් සිදු කෙරේ. ප්‍රජාවගේ කණ්ඩායම්, රාජ්‍ය නොවන සංවිධාන (රානොස) කම්කරු වෘත්තිය සමිති, දේශීය කණ්ඩායම්, පුණ්‍ය කටයුතු පිළිබඳ සංවිධාන, විශ්වාසය පදනම් කරගත් සංවිධාන, වෘත්තීමය ආයතනයන් සහ පදනම්.

III. විවිධ උගතුන් විසින් "රාජ්‍ය නොවන සංවිධාන" වෙනස් අන්දම් වලින් නිර්වචනය කර ඇති නමුත්, 1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජසේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) පනත රාජ්‍ය නොවන සංවිධාන පහත සඳහන් අන්දමට නිර්වචනය කර ඇත.

ඒ අනුව,

- ස්වේච්ඡා පදනම මත තනි පුද්ගලයන් කණ්ඩායමක් පිහිටවූ සහ ස්වභාවයෙන් රාජ්‍ය නොවන,
- එහි ක්‍රියාකාරකම් ඉටු කිරීමට මහජන දායකත්වය, පුණ්‍යාධාර, රජයේ ආධාර සහ දේශීය සහ විදේශීය පරිත්‍යාග මත යැපෙන,
- මානසික වශයෙන් ආබාධිත හෝ කායිකව හැකියාවකින් තොර පුද්ගලයන්, දිළිඳු පුද්ගලයන්, අනත්දරුවන් සහ අසරණ පුද්ගලයන් සඳහා ආධාර සහ සේවා සැපයීම සහ ස්වාභාවික ව්‍යසන අවස්ථා වලදී සහන සැලසීම එහි ප්‍රධාන අරමුණ ලෙස ඇති ඕනෑම සංවිධානයක්

රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස නම් කළ හැකිය.

IV. මෙම ශ්‍රීලනිපප්‍ර අදාළවියයුතු අතිවිශාල විවිධත්වයෙන් යුත් රාජ්‍ය නොවන සංවිධානවල කැපී පෙනෙන පොදු ලක්ෂණයන් වන්නේ,

(අ) ඒවා එක්කෝ ප්‍රාදේශීය (යම් විශේෂ වූ වපසරියකට) ජාතික හෝ අන්තර්ජාතික ස්වේච්ඡා සංවිධාන ;

(ආ) පොදුවේ සමාජය, සමාජයේ විශේෂ අවදානමකට ගොදුරුවිය හැකි කණ්ඩායමක් හෝ විශේෂයෙන් හඳුනාගත් ඇල්මක් හෝ ඉලක්ක ගත කණ්ඩායම්වල යහපත හඳුනාගත් ඔවුන්ගේ නිශ්චිත අරමුණ(ණු) විධිමත්ව සකස්කර තිබීම ;

(ඇ) ව්‍යාපාරික අස්තිත්වයන් මෙන් නොව ඔවුන්ගේ අරමුණුලාභ අපේක්ෂාව නොවීම ;

(ඈ) ලාසනොසවල ලාභ උත්පාදනය වියහැකි නමුත්, හිමිකමේ ඇල්මක් නොමැති නිසා ඒවා සම්පත් සපයන්නන් අතර බෙදාහැරීමක් සිදු නොවීම ;

(ඉ) සංවිධානයේ අරමුණ(ණු)හෝ පරමාර්ථ ප්‍රවර්ධනය කර ගැනීම සඳහා මූල්‍ය ආධාර එක්කෝ සමාජයේ එක් එක්පුද්ගලයන්ගෙන් (පුද්ගලයන් කණ්ඩායමක්), සංස්ථාමය අස්තිත්වයන් ගෙන්, රාජ්‍ය අංශයේ අස්තිත්වයන්ගෙන්, අන්තර්ජාතික සංවිධාන වලින් හෝ ස්වෛරී රාජ්‍යයන්ගේ නියෝජිත ආයතනයන්ගෙන් ඔවුන් ඉල්ලීම් කර ලබාගැනීම ;

(ඊ) ඔප්පුවකින් වන මූල්‍ය පැවරුම් සංවිධානයේ අරමුණ(ණු) ප්‍රවර්ධනය කරගැනීමේ අභිප්‍රාය(යන්) සඳහා කරනු ලැබීම.

*3.1.2* ***පරිත්‍යාග / දායකවීම්, ප්‍රදාන, සාමාජික මුදල්***

I. ලාසනොස වල සම්පත් වල වැදගත් කොටසක් ප්‍රදාන සංවිධාන වලින් හෝ තනි පුද්ගලයන්ගෙන් වන ප්‍රදානයන් සහ / හෝ දායකවීම්, සහ රාජ්‍ය ප්‍රදාන වලින් සමන්විත වේ. උදාහරණ වශයෙන් නිශ්චය කරන ලද සේවාවක් හෝ කාර්යයක් භාරදීමට හෝ ඉටු කිරීමට වන බැඳීමක් බොහෝවිට මෙම දායකවීම් වලට ඇඳී ඇති අතර එවැනි සිදුවීමක්"සීමාකර ඇති අරමුදල්" වල කොටසක් ලෙස සැලකිය යුතුය.

II. තනි පුද්ගලයන්ගෙන් හෝ ආයතන වලින් ලැබෙන පරිත්‍යාග / දායකවීම් වලින්,

- කුමන මාර්ගයකින් ලැබුනද සදාචාරාත්මක බැඳීමක් ;
- ඉල්ලා සිටි කරුණ සඳහා අරමුදල් භාවිත කිරීම සඳහා වූ නෛතික බැඳීමක් ;
- භාවිතය නිශ්චය කර ඇති සීමාකර ඇති අරමුදල් ඇති කරයි.

III. බැඳ තබා ගන්නා සිද්ධියක් නෛතික බැඳීමක් වන අතර, උදාහරණයක් වශයෙන් ගිවිසුමකින් පැන නගින ව්‍යවසායක් වෙන විකල්පයක් නොමැතිව එම බැඳීම නිරවුල් කිරීම හෝ ඉටු කිරීම ප්‍රතිඵලය වීම.

IV. දායකවීම් ලැබෙනු ඇතැයි සාධාරණ ලෙස සහතික වීමක් තිබේ නම් සහ අදාළ වන අවස්ථාවලදී එයට ඇඳුන කොන්දේසි සංවිධානය ඉටු කළා හෝ ඉටුකරනු ඇතැයි නම් හැර එතෙක් දායකවීම් (පරිත්‍යාග හෝ ප්‍රදාන) පිටතින් එන සම්පත් ලෙස හඳුනා නොගත යුතුය. අරමුදල් ලැබීමම දායකවීම් වලට ඇඳුන කොන්දේසි ඉටුකලා හෝ ඉටු කරනු ඇතැයි යන්නට තීරණාත්මක සාක්ෂි නොසපයයි. කොන්දේසි සපුරාලන තෙක් දායකවීම් සීමාකර ඇති අරමුදල් වල කොටසක් ලෙස සැලකිය යුතුය.

V. බොහෝ ලාසනොස වල සාමාජික මුදල් පිටතින් එන සම්පත්වල මූලිකාංගයක් වේ. සාමාජික මුදල් මගින් අවසර ලැබෙන්නේ සාමාජිකත්වයට පමණක් නම් සහ අන් සියලුසේවා සහ නිෂ්පාදන සඳහා සාමාජිකයා ගෙවීම් කරනු ලබන්නේ නම්, ඒවා හඳුනාගන්නේ ලැබුන විටය. වර්ෂය තුළදී සාමාජිකයනට සේවා හෝ ප්‍රකාශන ලබාදීම සඳහා සාමාජික ගාස්තුවලට හිමිකමක් ඇත්තේ නම් කාල නියමය සහ සියලුම සේවාවල ස්වභාවය සැලකිල්ලට ගෙන ක්‍රමවත් සහ තර්කාන්විත පදනමක් මත සාමාජික ගාස්තු හඳුනා ගත යුතුය.

### *3.1.3 පරිත්‍යාග ගිවිසුම්*

I. බොහෝ ලාසනොස, ප්‍රදානය කරන්නා සමග විධිමත් ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තු වලට එළඹෙන අතර, ඒ අනුව අදාළ ප්‍රදානය කරන්නා විසින් මූල්‍යන කරන ලද සේවයක් / කාර්යයක් භාරදීමට / ඉටුකිරීමට ඔවුන් බැඳීමට ලක්වේ. නිශ්චිත ක්‍රියාකාරකම් යනු කුමක්ද, කොහේදීද, කුමන අවස්ථාවේදී සිදුවිය යුතුද යන්න පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක් ගිවිසුම හෝ කොන්ත්‍රාත්තුව මගින් ලබාදෙනු ඇත. උදාහරණ වශයෙන් වාර්තාකරන අවශ්‍යතාවයට අනුරූපව අයවැය ලේඛණයන් සහ කොන්දේසි සහ නියමයන්ගේ ලැයිස්තුවක්, එළඹුණු ගිවිසුමේ, මුලුමනින්ම වාගේ, සෑමවිටම අත්‍යවශ්‍ය කොටසක් ලෙස ස්ථාපනය වී ඇත. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අමතරව සත්‍ය වියදම් අනුමත අයවැයලේඛණය සමග සසඳන ලද විචලන වාර්තාවක් ද එක්ව එම ක්‍රියාකාරකම් සහ විචලන වාර්තාවේ කාලය පරිච්ඡේදය ලෙස ගෙන ආවරණය කරමින් අනුරූපී විස්තරාත්මක ප්‍රගති වාර්තාවක් ද බොහෝවිට ඉල්ලා සිටී. ඒ අනුව මෙම වාර්තා ප්‍රදානය කරන්නා සහ ලාසනොස අතර ගිවිසුමේ විස්තර කර ඇති අවශ්‍යතාවයන්ගෙන් වැදගත් කොටසක්, බොහෝවිට ස්ථාපනය වේ. මෙම වාර්තා මූල්‍ය ප්‍රකාශන හා පද සම්බන්ධය ඇතිවකියවූ විට බොහෝ අවස්ථාවලදී ප්‍රදානය කරන්නාට ක්‍රියාකාරකම්වල නිමවී ඇති ප්‍රමාණය තක්සේරු කිරීමට සහ එකඟ වූ අරමුණු සහ කොන්දේසි මුදුන්පත් කරගෙන ඇත්ද, නැද්ද යන්න නිර්ණය කිරීමට ප්‍රයෝජනවත් මෙවලමක් සපයයි.

II. සීමාකිරීම් හෝ බැඳීම් ඇඳී ඇත්තේ විශාල ප්‍රදාන නියෝජිත ආයතන වලින් සපයන අරමුදල් වලට පමණක් නොව බොහෝ අවස්ථාවලදී එය තනි පුද්ගලයන්ගෙන් ලැබෙන දායකවීම් වලටත් එක සේ අදාළ වේ. අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාරයකදී, උදාහරණ වශයෙන් ලාසනොස නිශ්චිත කාරණයක් සඳහා අරමුදල් රැස් කිරීම සඳහා මහජනයා වෙත බැල්ම හෙළීමේදී ලිඛිත ගිවිසුමක් තිබිය නොහැකි වූයේ වුවද පාර්ශ්වයන් අතර පැහැදිලි අවබෝධයක් තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස අරමුදල් රැස්කිරීමේ ව්‍යාපාරය තුළ ප්‍රකාශ කළ පරිදි සහ එකතුකරගත් අරමුදල්, එම නිසා සීමාකාරී ලෙස සැලකිය යුතුය.

III. කිසියම් සෘජු ඉල්ලීමක් නොකර හෝ ප්‍රයෝජනයට ගන්නා ආකාරය පිළිබඳව නිර්වචිත කොන්දේසි හෝ නියමයන් පැනවීමකින් තොරව පරිත්‍යාග ලෙස ලැබෙන අරමුදල් සීමා නොකරන ලද ඒවා වේ. එවැනි තත්ත්වයන් තුළ එම අරමුදල් ප්‍රයෝජනයට ගනු ලබන්නේ ලාසනොස අරමුණු ඇතුළත බවට ලිඛිත නොවන ගිවිසුමක් වනු ඇත.

IV. එම පද සම්බන්ධයෙන්ම ලැබුණ අරමුදල් වලින් කොපමණ ප්‍රමාණයක් පොදු පරිපාලන වියදම් සහ ලාසනොස මධ්‍යම කාර්යාලයේ පිරිවැය දැරීම සඳහා ප්‍රයෝජනයට ගනු ලැබුවේද යන්න පිළිබඳව පැහැදිලි විනිවිදභාවයක් තිබිය යුතුය.

### *3.1.4 සීමාකරන ලද අරමුදල්*

V. ආසන්න වශයෙන් සියලුම ලාසනොස ඔවුන්ගේ සමස්ථ පරමාර්ථ ඇතුළත විශේෂ අරමුණු සඳහා පමණක් ව්‍යවහාර කළ හැකි අරමුදල් රඳවාතබා ගනී. මෙම අරමුණු බොහෝ අවස්ථාවලදී ප්‍රදානය කරන්නන් විසින් පනවනු ලබන අතර (රජය හෝ වෙනත් ප්‍රදානය කරන්නන් හෝ වේවා) සහ ගිවිසුමේ ඇතුළත් වීම හෝ අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාරයක් තුළදී මාධ්‍ය හෝ වෙනත් සමාන ස්වරූපයේ සංනිවේදන හරහා කරනු

ලබන නිවේදන මගින් ස්වයං පනවන ලද ඒවා විය හැකිය. එවැනි විශේෂිත භාවිතය සඳහා රඳවාගෙන ඇති අරමුදල් සීමා කරන ලද අරමුදල් වන අතර ඒවා මූල්‍ය ප්‍රකාශනවල වෙන්ව ගිණුම්ගත කළ යුතුය. මුල් සීමාකිරීම් වලින් පැන වූ කොන්දේසි විශේෂිතව අන් අයුරකින් සඳහන් නොකරන්නේ නම් හැර සීමාකරන ලද අරමුදලක රඳවා තබාගෙන ඇති වත්කමකින් උත්පාදනය වන ආදායම සාමාන්‍යයෙන් මුල් අරමුදලේ කොන්දේසි හා සමාන කොන්දේසිවලට යටත් වේ.

VI. වෙනස් ස්වභාවයක සීමා කරනලද අරමුදලක් "නිත්‍ය ආදායම්" වන අතර එය සංවිධානයේ යහපත සඳහා ප්‍රාග්ධන අරමුදලක් වශයෙන් භාරයක රඳවා තබාගනු ලැබේ. එවැනි අරමුදල් සංවිධානයේ ආදායමක් වී යයි සලකා සාමාන්‍යයෙන් වියදම් කළ නොහැකිය. කෙසේ වෙතත් එවැනි ප්‍රාග්ධනයෙන් උපයාගත් ආදායම සංවිධානයේ සීමාකරන ලද හෝ වෙනත් අරමුණු සඳහා ප්‍රයෝජනයට ගත හැකිය. සමහර අවස්ථාවලදී නිත්‍ය ආදායම් ප්‍රාග්ධනය, ආදායමට පරිවර්තනය කිරීමට පාලක මණ්ඩලයට අභිමතානුසාරී බලයක් තිබිය හැකිය. පාලක මණ්ඩලයට එහි අභිමතය තුළ ලාසනොසහි ඕනෑම අරමුණක් සඳහා හෝ නිශ්චිත අරමුණක් සඳහා පමණක් අරමුදල් වියදම් කිරීමට අවසර තිබේද යන්න මත යැපෙමින් එවැනි අවස්ථාවකදී සහ එවැනි බලය ක්‍රියාත්මක කරන්නේ නම් අදාළ අරමුදල සීමාකරන ලද ආදායම් හෝ සීමා නොකරන ලද ආදායම් බවට පත්වේ. කුමන අවස්ථාවක වුවද නිත්‍ය ආදායම් අරමුදල සීමාකරන ලද අරමුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල වෙන්ව ගිණුම්ගත කළ යුතුය.

*3.1.5* ***සීමා නොකරන ලද අරමුදල්***

I. පාලක ලියවිල්ලේ පැහැදිලි කර ඇති පරිදි ලාසනොස වල පොදු අරමුණු සඳහා ලබාගත හැකි සම්පත් බොහෝ ලාසනොස වලට ඇත. මෙය ලාසනොස වල "සීමා නොකරන ලද" හෝ "පොදු" අරමුදලය. සීමා නොකරන ලද අරමුදල දරන වත්කම් වලින් උත්පාදනය වන ආදායම සීමා නොකරන ලද ආදායමක් වේ.

II. අනාගතයේදී දිනයක විශේෂ අරමුණු සඳහා භාවිතා කිරීමට ලාසනොස සීමා නොකරන ලද අරමුදල් වලින් කොටසක් ලාසනොස යේ පාලක මණ්ඩලය වෙන් කර තැබිය හැකිය. අනාගතයේ දිනයකදී එවැනි අරමුදල් සීමා නොකරන ලද අරමුදල් තුළ යළි නම් කිරීමට පාලක මණ්ඩලයට බලය තිබෙන නිසා ඒවා " නම් කරනලද අරමුදල්" ලෙස විස්තර කළයුතු අතර සහ ආනුෂංගික වශයෙන් ලාසනොස සීමා නොකරන ලද අරමුදලේ කොටසක් ලෙස ගිණුම්ගත කළ යුතුය.

*3.1.6* ***සමුච්චිත අරමුදල***

I. ගිණුම්කරණය පිළිබඳව ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය සමුච්චිත අරමුදල "වියදමට වඩා වැඩි ආදායමේ අතිරික්තය බැර කරන සහ යම් ඌණතාවයක් හර කරන ලාභ නොලබන ආයතන රඳවා ගෙන ඇති අරමුදල" ලෙස නිර්වචනය කරයි. සමුච්චිත අරමුදල් වල වටිනාකම සංවිධානයේශුද්ධ වත්කම් (එනම්ඃ වත්කම් වලින් වගකීම් අඩුකිරීමෙන්) ඕනෑම වේලාවක ගණනය කළ හැකිය. සමුච්චිත අරමුදල ලාභලබන සංවිධානයක ප්‍රාග්ධනයේ සමක වේ."

II. කෙසේ වෙතත් ලාසනොස වලට හිමිකමේ ඇල්මක් හෝ ලාභ පිළිබඳව වාණිජ අස්තිත්වයන් හා සමාන තේරුමක් නොමැති වූයේ නමුදු "කාලපරිච්ඡේදයක් තුළ සම්පත් ගලා ඒම සහ ගලායාම අතර සම්බන්ධතාවය"පිළිබිඹු වීමට ප්‍රාග්ධනය පවත්වාගෙන යාමේ සංකල්පය හෝ එහි සමකයන් ඔවුනට අවශ්‍ය වේ. සංවිධානයකට එකම කාල සීමාවක් තුළ පෙර කාල සීමාවලදී ලැබුණු, තවමත් ප්‍රයෝජනයට නොගත් හෝ අනාගත කාලසීමාවලදී ප්‍රයෝජනයට ගැනීම සඳහා වෙන් කර තබනු ලැබූ සම්පත්වලින් රැගෙන ප්‍රයෝජනයට ගත හැකිය.

III. ලාසනොස සමුච්චිත අරමුදල පවත්වාගෙන යාම පදනම් වන්නේ එහි මූල්‍ය ප්‍රාග්ධනය පවත්වාගෙන යාමේ පදනම මතය. ලාසනොසයක කාලපරිච්ඡේදයක් අවසානයේදී ශුද්ධ වත්කම්වල මූල්‍ය වටිනාකම, එම කාලපරිච්ඡේදය ආරම්භයේදී එහි ශුද්ධ වත්කම්වල මූල්‍ය වටිනාකමට සමානවන්නේ නම් හෝ වැඩිවන්නේ නම් එම ලාසනොස ය ප්‍රාග්ධනය පවත්වාගෙන ගොස් ඇත.

IV. ලාසනොස වලට එහි සමුච්චිත අරමුදල පවත්වාගෙන යාමට අපොහොසත්වුවහොත් එහි සේවා අඛණ්ඩව සැපයීමට එයට ඇති හැකියාව ක්‍රමයෙන් අඩුවන අතර අනාගත ප්‍රතිලාභීන්ට සේවා සැපයීමට ඇති හැකියාවට එය බලපායි. එවැනි අඩුවීමක් වැළැක්වීමට හැකි වනු පිණිස අරමුදල් රැස් කිරීම වැනිදෑ මගින් සංවිධානයට ආදායම් උත්පාදනය කිරීමට හැකියාවක් තිබේ නම් හැර අනාගත සම්පත් සපයන්නන් හට එම අඩුව පිරවීමට සිදුවිය හැකිය.

V. සීමා කරන ලද අරමුදල් වලින් ලාසනොසයක සමුච්චිත අරමුදලේ වැදගත් කොටසක් සමන්විත වේ. එබැවින් සීමා කරන ලද සමුච්චිත අරමුදල සහ පොදු සමුච්චිත අරමුදල වෙන්කොට හඳුනාගැනීම වැදගත් වේ.

*3.1.7 පාලක මඩුල්ල*

I. ලාසනොසයක පාලක මඩුල්ල සමාගමක අධ්‍යක්‍ෂ මණ්ඩලයට සමාන වේ. කෙසේ වෙතත් ලාසනොස සම්බන්ධයෙන් මෙය පාලක මණ්ඩලය, හෝ සාමාජිකයන්ගේ උපදේශක සභාව හෝ වෙනත් සමාන නමකින් හැඳින්විය හැකිය.

*3.2 පරිශීලකයන් සහ ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා*

3.2.1 ලාසනොස වල මූල්‍ය ප්‍රකාශන විවිධ පුද්ගලයන් (ව්‍යවස්ථාපිත හෝ සංස්ථාපිත ආයතන වෙනත් රානොස හෝ පුද්ගලයන්) වෙනස් අරමුණු සඳහා භාවිත කරන අතර ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාවයන් සැලකිය අන්දමේ වෙනස්වීම් වලට භාජනය වේ. සංස්ථාපිත අංශයේ මෙන් නොව ලාසනොස සඳහා හිමිකරුවන් හෝ ආයෝජකයන් නොමැත. වඩාත් සුලබව ලාසනොස වල මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන් ගේ කණ්ඩායම් වන්නේ සම්පත් සපයන්නන් හෝ දායකවන්නන් (එනම් වෙනස් වර්ගවල ප්‍රදානය කරන්නන්), ප්‍රතිලාභීන් (වෙනස් ඉලක්කගත කණ්ඩායම්), සැපයුම්කරුවන් / ණයහිමියන්, සේවකයන් සහ බලධාරීන්ය. සමහර ලානොසවලට පරිශීලනය කරන්නන්ගේ අත්‍යාවශ්‍ය කණ්ඩායමක් නියෝජනය කරන සාමාජිකයන් ඇත. අනෙක් අයට ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කරන හවුල් සංවිධාන සිටිය හැකි අතර, ඔවුන් මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන වැදගත් අයයි.

3.2.2 විවිධ පරිශීලකයන්ගේ තොරතුරු අවශ්‍යතා පිළිබඳ සමහර උදාහරණ පහත ලැයිස්තුගත කර ඇත.

**සාමාජිකයන්**
- දී ඇති උපදේශවලට අනුකූලව අරමුදල් භාවිතයේ යොදවා ඇද්ද?
- දී ඇති පාලන නිමයමන්ට (අතුරු නීති හෝ ඒ සමාන) අනුව ලාසනොස කටයුතු කෙරේද
- පාදක කරගත් ව්‍යවස්ථාව හෝ නියාමනය කුමක්ද සහ එවැනි නියාමනයන් ඉටුකර ඇත්ද?

**සම්පත් සපයන්නන්හට**
- ලාසනොස එකඟවූ ප්‍රතිලාභී අරමුණු මුදුන් පත් කරගැනීමට සුදුසුද?
- ලාසනොස යහපත් භාරකාරත්වයන් ප්‍රදර්ශනය කර තිබේද?
- ලාසනොස කාර්යක්ෂම හා සඵලදායී ලෙස ක්‍රියාකරයිද?
- ලාසනොස වගකිව යුතු ආධාර කිරීම දීර්ග කළ යුතු හෝ දිගටම පවත්වා ගෙන යා යුතුද?
- ලාසනොස යට ලත් පැවරුම ඇතුළත හඳුනාගත් පරිදි සහ එකඟ වූ පරිදි අරමුදල් යොදවා ඇද්ද?
- ලාසනොස එකඟ වූ සීමාකිරීම්/අවශ්‍යතාවයන් පිළිපැද ඇද්ද?
- එකඟ වූ පරිදි ව්‍යාපෘතීන් ක්‍රියාවේ යෙදවීමට ලාසනොසයට ව්‍යුහයන් හෝ / සහ හැකියාවන් තිබේද?

**ප්‍රතිලාභීන්ට**
- දී ඇති උපදේශ ප්‍රකාරව ලාසනොස උපකාර / සේවාවන් සපයයිද?
- ලසනොසයට අනාගත උපකාර/ සේවා සැපයීමට ඇති හැකියාව සතුව පවතීද,
- පද්ධති අපේක්ෂා කල පරිදි ක්‍රියා කරයි ද?

**සැපයුම්කරුවන් ණයහිමියන්**
- ලාසනොස විශ්වාසනීයද?
- එයට එහි ණය නියමිත දිනවල නිරවුල් කිරීමට හැකිද?

**සේවකයන්ට**
- ලාසනොස ආරක්ෂාකාරී, සුරක්ෂිතව වැඩකළ හැකි ස්ථානයක්ද?
- වැටුප් සහ අනෙකුත් එකඟ වූ ප්‍රතිලාභ නියමිත පරිදි වෙලාවට ගෙවීමට ලාසනොසට හැකිද?
- එහි අරමුණු ක්‍රියාවට නැංවීමට සහ සඳහන් කර ඇති සේවා සැලසීමට ලාසනොසයට මූල්‍යමය වශයෙන් හැකියාව තිබේද?

| | |
|---|---|
| බලධාරීන් | • අදාළ ව්‍යවස්ථාපිත සහ නෛතික අවශ්‍යතාවයන් සමග ලානොස අනුකූලවේද (ලියාපදිංචිය / බදු / වාර්තාකරන අවශ්‍යතා ආදිය)?<br>• ලානොස කටයුතු තවදුරටත් නීතිමය බැඳීම්වලට යටත් කළ යුතුද?<br>• එහි කටයුතු සහ සම්පත් උපයෝගී කිරීමේදී විනිවිදභාවයක් ඇද්ද? |
| හවුල්කරුවන්ට | • අදාළ අරමුණු / උපදේශ සමග අනුකූලව ලබාගත හැකි අරමුදල් එකඟ වූ පරිදි ප්‍රයෝජනයට ගන්නේද? |

*3.3 ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ගති ලක්ෂණ*

3.3.1 මූල්‍ය තොරතුරු ප්‍රයෝජනවත් වීමට නම් එයින් නියෝජනය කිරීමට අරමුණු කරගත් දෑ අදාළ සහ විශ්වාසදායී ලෙස නියෝජනයවිය යුතුය. මූල්‍ය තොරතුරු සංසන්දනය කළ හැකිනම්, සත්‍යාපනය කළ හැකි නම්, කාලානුරූපීනම් සහ තේරුම්ගත හැකිනම් එහි ප්‍රයෝජනවත්භාවය වැඩිවේ.

**මූලික ගුණාත්මක ගති ලක්ෂණ**

3.3.2 මූලික ගුණාත්මක ගති ලක්ෂන වන්නේ අදාළ බව සහ විශ්වාසදායී නියෝජනයයි.

අදාළ බව

3.3.3 පරිශීලකයන් ගත් තීරණවල වෙනසක් සිදුකිරීමට අදාළ මූල්‍ය තොරතුරුවලට හැකියාවක් ඇත. සමහර පරිශීලකයින් තොරතුරු වලින් ලැබන වාසි සහගතතත්ත්වය ප්‍රයෝජනයට ගැනීමට තෝරා නොගන්නේ වුවද හෝ දැනටමත් වෙනත් මූලාශ්‍ර වලින් ඒ පිළිබඳ දැනගෙන සිටියේ වූ නමුදු, තීරණයක වෙනසක් සිදුකිරීමට තොරතුරුවලට හැකියාවක් තිබිය හැකිය.

3.3.4 මූල්‍ය තොරතුරුවලට භාවිකථන (අනාවැකි පළ කිරීමේ) වටිනාකමක්, තහවුරු කිරීමෙ වටිනාකමක් හෝ ඒ දෙකම තිබේ නම් මූල්‍ය තොරතුරුවලට තීරණ වෙනස් කිරීමේ හැකියාවක් ඇත.

3.3.5 අනාගත ප්‍රතිඵල පුරෝකථනය කිරීමට පරිශීලකයන් යොදාගන්නා ක්‍රියාවලි වලට යෙදවුම් ලෙස මූල්‍ය තොරතුරු භාවිත කළ හැකිනම් මූල්‍ය තොරතුරුවලට භාවිකථනවටිනාකමක් තිබේ. මූල්‍ය තොරතුරු භාවිකථන අගයක් තිබීමට, අනාවැකි හෝ පුරෝකථන වීම අවශ්‍යනොවේ. භාවිකථන අගයක් ඇති මූල්‍ය තොරතුරු පරිශීලකයන් විසින් ඔවුන්ගේම ස්වකීය අනාවැකි ඇතිකිරීමේදී යොදාගනු ඇත.

3.3.6 කලින් ඇගයීම්වල පසුවිපරමක් (සනාථ කිරීමක් හෝ වෙනසක්) සපයන්නේ නම් මූල්‍ය තොරතුරුවල තහවුරු කිරීමේ අගයක් ඇත.

3.3.7 මූල්‍ය තොරතුරුවල භාවිකථන අගය සහ තහවුරු කිරීමේ අගයන් අන්තර් සම්බන්ධිතය. භාවිකථනය තොරතුරුවල බොහෝවිට තහවුරු කිරීමේ අගය ද ඇත. උදාහරණ වශයෙන් ප්‍රවර්තන වසරේ අයභාර තොරතුරු අනාගත වර්ෂවල අයභාර අනාවැකි සඳහා පදනමක් ලෙස භාවිත කිරීමට හැකි මෙන්ම පසුගිය වර්ෂවල කරන ලද ප්‍රවර්තන වර්ෂයේ අයභාර අනාවැකි සමගද සංසන්දනය කළ හැකිය. එම සංසන්දනවල ප්‍රතිඵල කලින් කල එම අනාවැකි භාවිත කිරීමට යොදාගත් ක්‍රියාවලින් නිවැරදි කිරීමට හෝ වැඩිදියුණු කිරීමට පරිශීලකයෙකුට උදව් වියහැකිය.

**ප්‍රමාණාත්මකභාවය**

3.3.8 නිශ්චය කරන ලද වාර්තාකරණය අස්තිත්වයක මූල්‍ය තොරතුරු පදනම් කර පරිශීලකයන්ට තොරතුරක් අත්හැරීම හෝ අවප්‍රකාශය නිසා ගන්නා ලද තීරණයට බලපෑමක් වේ නම් එම තොරතුරු ප්‍රමාණාත්මක වේ. වෙනත් වචන වලින් කිවහොත් ප්‍රමාණාත්මකභාවය යනු, තනි අස්තිත්වයක මූල්‍ය වාර්තාව සම්බන්ධයෙන් ගත්කළ තොරතුරු අදාළ වන අයිතමවල ස්වභාවය සහ විශාලත්වය හෝ ඒ දෙකම හෝ මත පදනම් වූ අස්තිත්වය නිශ්චිත පැතිකඩකි.

ඒ නිසාවෙන් යම් විශේෂ තත්ත්වයකදී ප්‍රමාණාත්මක බවසඳහා ඒකාකාරී ප්‍රමාණාත්මක ප්‍රවේශ ලක්‍ෂයන් නිශ්චය කිරීම හෝ කලින් නිර්ණය කිරීම කළ නොහැකිය.

**විශ්වාසදායී නියෝජනය**

3.3.9 මූල්‍ය වාර්තා ආර්ථික සංසිද්ධියක් වචනවලින් සහ සංඛ්‍යාවලින් නියෝජනය කරයි. ප්‍රයෝජනවත් වීමට මූල්‍ය තොරතුරු අදාළ සංසිද්ධිමය නියෝජනය කිරීම පමණක් නොව එය නියෝජනය කිරීමට අරමුණු කරගත් සංසිද්ධිය විශ්වාසදායකලෙස නියෝජනය කිරීමද සිදුවිය යුතුය. සම්පූර්ණ විශ්වාසදායක නියෝජනයක් වීමට, නිරූපනයකට ගතිලක්ෂණ තුනක් තිබිය යුතුය. ඒවා වියයුත්තේ සම්පූර්ණබව,මධ්‍යස්ථ බව සහ වැරදි වලින් තොරවීමය. කවදා හෝ සාක්ෂාත් කළ හැක්කේ නම් සැබවින්ම පරිපූර්ණත්වය විරල දෙයකි. අරමුණවන්නේ එම ගුණාංග හැකිතාක්දුරට උපරිම කිරීමය.

3.3.10 සම්පූර්ණ නිරූපනයකට නිරූපණය කළ සංසිද්ධිය, පරිශීලකයකුට තේරුම් ගැනීමට අවශ්‍ය සියලු විස්තර සහ පැහැදිලි කිරීම්ද ඇතුළුව අවශ්‍ය සියලු තොරතුරු ඇතුළත් වේ. උදාහරණයක් වශයෙන් වත්කම් සමූහයක සම්පූර්ණ නිරූපණයකට අවම වශයෙන් සමූහයේ ඇති වත්කම් වල ස්වභාවය පිළිබඳ විස්තරයක්, සමූහයේ ඇති සියලුම වත්කම් වල සංඛ්‍යාත්මක නිරූපණයක්, සංඛ්‍යාත්මක නිරූපනයෙන් නියෝජනය වන්නේ කුමක්දැයි යන්න පිළිබඳව විස්තරයක් (උදාහරණ වශයෙන් මුල් පිරිවැය, ගලපන ලද පිරිවැය හෝ සාධාරණ වටිනාකම) ඇතුළත් විය හැකිය. සමහර අයිතම සඳහා සම්පූර්ණ නිරූපණයකට අයිතමවල ගුණාත්මකභාවය සහස්වභාවය පිළිබඳව වැදගත් කරුණු සහ පැහැදිලි කිරීම් ඒවායේ ගුණාත්මකභාවය සහ ස්වභාවය බලපෑ හැකි සාධක සහතත්ත්වයන් සහ සංඛ්‍යාත්මක නිරූපණය නිර්ණය කිරීමට භාවිතා කළ ක්‍රියාවලිය ද අයත් විය හැකිය.

3.3.11 මූල්‍ය තොරතුරු තෝරාගැනීමේදී හෝ ඉදිරිපත් කිරීමේදී ඒවායින් නිරූපණය පක්ෂග්‍රාහීත්වයෙන් තොර වේ. මූල්‍ය තොරතුරු සතුටුදායක ලෙස හෝ අසතුටුදායක ලෙස පරිශීලකයන් භාර ගැනීමට ඇති සම්භාව්‍යතාවය වැඩි කිරීමට අන්වශයෙන් තමන්ගේ වාසියට හැරවීම පසෙකට බරවීම, බරතැබීම, අවධාරනය කිරීම, අවධාරණය නොකිරීම ස්වාධීන නිරූපණයකින් නොවිය යුතුය. ස්වාධීන තොරතුරු යනු අරමුණක් නොමැති හැසිරීම පිළිබඳ බලපෑමක් නැති තොරතුරු ලෙස අදහස් නොකෙරේ. මෙයට පටහැනිව, නිර්වචන මගින් අදාල මූල්‍ය තොරතුරු යන්න, පරිශීලකයන්ගේ තීරණ වෙනසක් සිදුකිරීමට හැකියාවක් ඇති තොරතුරු ලෙස සඳහන් වේ.

3.3.12 විශ්වාසදායී නියෝජනය යන්නෙන් සියලු අංගයන්ගෙන් නිවැරදි යන්න අදහස් නොකෙරේ. වැරදි වලින් තොර යන්නෙන් අදහස් කෙරෙන්නේ, සංසිද්ධිය විස්තර කිරීමේදී වැරදි හෝ අතපසුවීම් නොමැති බව සහ වාර්තා කර ඇති තොරතුරු ඉදිරිපත් කිරීමට භාවිත කළ ක්‍රියාවලිය තෝරා ගැනීම සහ ව්‍යවහාර කිරීම වැරදිවලින් තොරව සිදුකර ඇති බවය. මේසම්බන්ධයෙන් වැරදි වලින් තොර යන්නට සියලු අංගයන්ගෙන් සම්පූර්නයෙන්ම නිවැරදිය යන්න අදහස් නොකෙරේ. උදාහරණ වශයෙන් නිරීක්ෂණය කළ නොහැකි මිලක් හෝ වටිනාකමක ඇස්තමේන්තුවක් නිවැරදිහෝ නිවැරදි නොවන බව නිර්ණය කළ නොහැකිය. කෙසේ වෙතත්, වටිනාකම පැහැදිලිව විස්තර කර සහ ඇස්තමේන්තුව නිවැරදි ලෙස සහ ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලියේ ස්වභාවය සහ සීමාකිරීම් පැහැදිලි කර සහ ඇස්තමේන්තු වර්ධනය කිරීම සඳහා උචිත ක්‍රියාවලිය තෝරාගැනීමේ සහ ව්‍යවහාර කිරීමේ වැරදි කර නොමැති නම්, එම ඇස්තමේන්තුවේ නියෝජනයක් විශ්වාසදායකවීමට පුලුවන.

3.3.13 විශ්වාසදායක නියෝජනයක් වීම මගින්ම, අත්‍යාවශ්‍යයෙන් ප්‍රතිඵලයක් ලෙස වැදගත් තොරතුරක් නොවේ. උදාහරණයක් වශයෙන් වාර්තා කරන අස්තිත්වයකට රාජ්‍ය ප්‍රදාන හරහා දේපල, පිරියත සහ උපකරණ ලැබිය හැකිය. පැහැදිලිවම, එම අස්තිත්වය වත්කමක් පිරිවැයක් නොමැතිව අත්පත් කරගත් බව වාර්තා කිරීම, එහි පිරිවැය විශ්වාසදායක ලෙස නියෝජනය කිරීමකි. එහෙත් එම තොරතුර සමහරවිට වඩා ප්‍රයෝජනවත් විය නොහැකිය. වත්කමේ වටිනාකමේ හානිකරණය පිළිබිඹු වීමට වත්කමේ ධාරණ අගයට ගැළපුම් කළ යුතු ප්‍රමාණය (වටිනාකම) ඇස්තමේන්තු කිරීම යාන්තම් වඩා සියුම් උදාහරණයකි. වාර්තාකරණ අස්තිත්වය සුදුසු ආකාරයට උචිත ක්‍රියාවලියවිස්තර කර, ඇස්තමේන්තු සුදුසු ලෙස විස්තර කර සහ ඇස්තමේන්තුවට සැලකිය යුතු ලෙස බලපෑහැකි ඕනෑම අනියතාවයක් විස්තර කර ඇත්නම් එම ඇස්තමේන්තු විශ්වාසදායක නියෝජනයන් විය හැකිය. කෙසේ වෙතත් එවැනි ඇස්තමේන්තුවක අනියතාවය සැහෙන තරම්දුරට විශාලතම එම ඇස්තමේන්තුව ඉතා විශේෂ ආකාරයකට ප්‍රයෝජනවත් නොවේ. වෙනත් වචනවලින් නම්වත්කමේ අදාලත්වයේ විශ්වාසදායක නියෝජනය සැකයටලක්වේ. වඩාත් විශ්වාසදායී විකල්ප නියෝජනයක් නොමැතිනම් එම ඇස්තමේන්තුව වඩාත්ම හොඳ ලබාගතහැකි තොරතුරු සැපයිය හැකිය.

**මූලික ගුණාත්මක ගතිලක්ෂණ ව්‍යවහාරකරණය**

3.3.14 තොරතුරු ප්‍රයෝජනවත් වීමට නම් ඒවා අදාළ මෙන්ම විශ්වාසනීයව නියෝජනය විය යුතුය. අදාළ නොවන සංසිද්ධියක විශ්වසනීය නියෝජනයක් හෝ අදාළ සංසිද්ධියක විශ්වසනීය නොවන නියෝජනයන් පරිශීලකයනට හොඳ තීරණ ගැනීමට උපකාරී නොවේ.

3.3.15 මූලික ගුණාත්මක ගති ලක්ෂණ ව්‍යවහාර කිරීම සඳහා වඩාත් කාර්යක්ෂම හා සඵල ක්‍රියාවලිය සාමාන්‍යයෙන් පහත දක්වෙන පරිදි විය හැකිය (මෙම උදාහරණයේදී සලකා නොලබන ගතිලක්ෂණ ඉහළ දැමීමේ බලපෑම් සහ පිරිවැය

සංරෝධක වලට යටත්ව). පළමුවෙන් වාර්තා කරන අස්තිත්වයේ මූල්‍ය තොරතුරු පරිශීලනය කරන්නන්ට ප්‍රයෝජනවත් විය හැකි, ආර්ථික සංසිද්ධියහඳුනාගැනීම. දෙවනුව, එම සංසිද්ධිය පිළිබඳවලබාගත හැකි වන්නේ නම්, වඩාත්ම අදාළ විය හැකි සහ විශ්වාසදායක ලෙස නියෝජනය වන තොරතුරු වර්ගය හඳුනාගැනීම. තෙවනුව, එම තොරතුරු ලබාගත හැකිද සහ විශ්වාසදායක ලෙසනියෝජනය කළ හැකිදැයි නිර්ණය කිරීම, එය එසේවන්නේ නම්, මූලික ගුණාත්මක ගතිලක්ෂණ, තෘප්ත කිරීමේ ක්‍රියාවලිය එම මොහොතේ නිමා වේ. එසේ නොමැති නම්, වඩාත්ම අදාළ ඊළඟ වර්ගයේ තොරතුරු සමග ක්‍රියාවලිය නැවත කරනු ලැබේ.

**ගුණාත්මක ගතිලක්ෂණ වැඩි කිරීම**

3.3.16 සැසඳිය හැකිවීම, සත්‍යාපනය කළහැකිවීම, කාලානුරූපීවීම සහ තේරුම්ගත හැකිවීම, අදාළ සහ විශ්වසනීය ලෙස නියෝජනය වන තොරතුරුවල ප්‍රයෝජනවත්භාවය වැඩි කරන ගුණාත්මක ගතිලක්ෂණ වේ. ක්‍රම දෙකම එක හා සමාන ලෙස අදාළ සහ විශ්වසනීය ලෙස නියෝජනය වන්නේ නම්, වැඩිදියුණු කරන ලද ගුණාත්මක ගති ලක්ෂණ ක්‍රම දෙකෙන් කුමන ක්‍රමය සංසිද්ධියනිරූපණය කිරීමට භාවිත කළ යුතුදැයි නිර්ණය කිරීමට උදව් විය හැකිය.

**සැසඳිය හැකිබව**

3.3.17 පරිශීලකයන්ගේ තීරණ විකල්ප අතරෙන් තෝරාගැනීමට සම්බන්ධ වේ. උදාහරණ වශයෙන් ආයෝජනයක් විකිණීම හෝ රඳවාතබාගැනීම හෝ එක් වාර්තාකරණ අස්තිත්වයක හෝ වෙනත් අස්තිත්වයක ආයෝජනය කිරීම ඒ නිසාවෙන්, එක වාර්තාකරන අස්තිත්වයක් පිළිබඳ තොරතුරු වෙනත් අස්තිත්වවල ඒ හා සමාන තොරතුරු සහ එම අස්තිත්වයේ ඒ හා සමාන තොරතුරු වෙනත් කාලපරිච්ඡේදයක් සඳහා හෝ වෙනත් දිනයක් සඳහා සැසඳිය හැකි නම් වඩාත් ප්‍රයෝජනවත් වේ.

3.3.18 සැසඳිය හැකිබව අයිතම් අතර ඇති සමානභාවය සහ වෙනස්කම් හඳුනාගැනීම සහ අවබෝධ කරගැනීම පරිශීලකයන්ට හැකියාව ලබාදෙන ගුණාත්මක ගතිලක්ෂණයකි. සැසඳිය හැකි බව වෙනත් ගුණාත්මක ගතිලක්ෂණ මෙන් නොවතනි අයිතමයකට සම්බන්ධ නොවේ. සංසන්දනයකට අඩුම වශයෙන් අයිතම දෙකක් අවශ්‍ය වේ.

3.3.19 සංගතභාවය සැසඳිය හැකිබවට සම්බන්ධිත වන නමුත්, එම දෙයම නොවේ. වාර්තා කරනුලබන අස්තිත්වයේ ඇතුළත, කාලපරිච්ඡේදයෙන් කාල පරිච්ඡේදයට හෝ අස්තිත්ව හරහා තනි කාලපරිච්ඡේදයකදී, එකම ක්‍රමයන් එකම අයිතමයන් සඳහා භාවිතා කිරීම සංගතභාවයෙන් යොමු කෙරේ. සැසඳියහැකි බව ඉලක්කයයි. සංගතභාවය එම ඉලක්කය මුදුන් පත්කර ගැනීමට උදව් කෙරේ.

3.3.20 සැසඳිය හැකිබව ඒකාකාරභාවය නොවේ. තොරතුරු සැසඳීමට නම් එක හා සමාන දේවල් එලෙසමද වෙනස් දේවල් වෙනස් ලෙසද පෙනිය යුතුය. සමාන දෑ වෙනස් ලෙස පෙන්වීමෙන් මූල්‍ය තොරතුරු සැසඳීම ඉහළ තලයකට නැංවීම කල නොහැක්කේ යම් සේද, එසේම සමාන නැති දෑ සමාන සේ පෙන්වීමෙන් ද එය සිදුකළ නොහැකිය.

3.3.21 මූලික ගුණාත්මක ගතිලක්ෂණතෘප්ත කර ගැනීම මගින්, යම් මට්ටමක සැසඳීමක් අත්පත් කරගැනීමහැකිවීමට පුළුවන. වෙනත් වාර්තා කරන අස්තිත්වයක, ඒ හා සමාන අදාළ ආර්ථික සංසිද්ධිමයක් විශ්වසනීය නියෝජනයන් සමග, වෙනත් ආර්ථික සංසිද්ධිමයකට විශ්වසනීය නියෝජනය, යම් මට්ටමක සංසන්දනාත්මකභාවය ස්වභාවයෙන්ම සතුව තිබිය යුතුය.

3.3.22 තනි ආර්ථික සංසිද්ධියකට විවිධ ක්‍රම මගින් විශ්වාසදායක ලෙස නියෝජනය කළහැකි නමුත්, එකම ආර්ථික සංසිද්ධියමය සඳහා විකල්ප ගිණුම්කරන ක්‍රමවලට ඉඩදීමෙන් සැසඳයි හැකි බව හීන වේ.

**සත්‍යාපනය කළහැකි බව**

3.3.23 සත්‍යාපනය කළහැකි බව, එය නියෝජනය කිරීමට අරමුණු කරගත් ආර්ථික සංසිද්ධිමය තොරතුරුවිශ්වාසදායක ලෙස නියෝජනය වන බව පරිශීලකයනට සහතික කිරීමට උපකාරී වේ. විශේෂ නිරූපනයක් විශ්වාසදායී නියෝජනයක් බව, අත්‍යාවශ්‍යයෙන්ම සම්පූර්ණ එකඟතාවයක් නොවූවත් වෙනස්, දැනුමැති සහ ස්වාධීන නිරීක්ෂණයන්ට පොදු එකඟතාවයකට එළඹිය හැකිබව සත්‍යාපනය කළහැකි බව යන්නෙන් අදහස් කෙරේ. සත්‍යාපනය කළයුතු ප්‍රමාණාත්මක තොරතුරු තනි ලක්ෂ්‍යයක ඇස්තමේන්තුවක් වියයුතු නැත. වියහැකි වටිනාකම් ශ්‍රේණියක් සහ සහසම්බන්ධිත සම්භාව්‍යතාවයන් පවා සත්‍යාපනය කළහැකිය.

3.3.24 සත්‍යාපනය ඍජු හෝ වක්‍ර විය හැකිය. ඍජු සත්‍යාපනය යන්නෙන් අදහස් කරන්නේ වටිනාකමක් හෝ වෙනත් නියෝජනයක් ඍජු නිරීක්ෂණ හරහා සත්‍යාපනය කිරීමය. උදාහරණයක් වශයෙන්. මුදල් ගණන් කිරීම. වක්‍ර සත්‍යාපනය

යන්නෙන් අදහස් කරන්නේ ආකෘතියකට සූත්‍ර හෝ වෙනත් ශිල්පක්‍රම සහ එම ක්‍රමවේදයම භාවිතා කරමින් නිමවුම් යළි ගණනය කිරීමෙන් යෙදවුම් පරීක්ෂාව. උදාහරණයක් නම් තොගවල ධාරණ වටිනාකම යෙදවුම් පරීක්ෂා කිරීමමගින් සත්‍යාපනය කිරීම (ප්‍රමාණයන් සහ පිරිවැය) සහ අවසාන තොග එම පිරිවැය ප්‍රවාහ උපකල්පනයන් භාවිත කරමින් යළි ගණනය කිරීම (උදාහරණයක් වශයෙන් මුලින් ආ මුලින් පිටවූ ක්‍රමය භාවිත කරමින්).

3.3.25 සමහර පැහැදිලි කිරීම් සහ ඉදිරි දැකුම් මූල්‍ය තොරතුරු, අනාගත කාල සීමා එළඹෙනතුරු සත්‍යාපනය කිරීම කෙසේවත් කළ නොහැකි වනු ඇත.

එම තොරතුරු භාවිතා කිරීමට පරිශීලකයනට උවමනාදැයි යන්න තීරණය කිරීමට උදව් කිරීම සඳහා, තොරතුරු රැස්කිරීමේ ක්‍රම සහ එම තොරතුරු සඳහා සහායවූ වෙනත් සාධකයන් සහ තත්ත්වයන් පාදක කරගත් උපකල්පන හෙළිදරව් කිරීමද සාමාන්‍යයෙන් අවශ්‍ය කෙරේ.

**කාල නිර්ණය**

3.3.26 කාල නිර්ණය යන්නෙන් අදහස් කරන්නේ තීරණ ගන්නන්ට ඔවුන්ගේ තීරණ වලට බලපෑම් කළ හැකි තොරතුරු පමා නොවී ඔවුනට ලබාගැනීමට තිබීමයි. තොරතුරු පැරණි වන තරමට එහි ප්‍රයෝජනවත්භාවය අඩුවේ. කෙසේ වෙතත්, සමහර තොරතුරු වාර්තා කරන කාලපරිච්ඡේදය පසුවී දිගුකාලයක් ගතවුවද ඒවා අඛණ්ඩව කාලානුරූපීවීමට හැකිය. උදාහරණ වශයෙන් එයට හේතු විය හැක්කේ, සමහර පරිශීලකයන්ට ප්‍රවණතා හඳුනාගැනීමට සහ ඒවා තක්සේරු කිරීමට අවශ්‍ය වීම නිසාය.

**තේරුම් ගත හැකි බව**

3.3.27 වර්ගීකරණය කිරීම, ස්වභාවය නිරූපණය කිරීම, පැහැදිලිව සහ සංක්ෂිප්තව තොරතුරු ඉදිරිපත් කිරීම එහි තේරුම්ගත හැකි භාවය ඇති කරයි.

3.3.28 සමහර සංසිද්ධි ආවේණිකව සංකීර්ණ වන අතර, තේරුම් ගතහැකි වන පරිදි සෑදිය නොහැකිය. එම සංසිද්ධිමයන් පිළිබඳව වන තොරතුරු මූල්‍ය වාර්තා වලින් බැහැර කිරීමෙන් එමමූල්‍ය වාර්තාවල තොරතුරු තේරුම් ගතහැකිවීම පහසු කරගත හැකිවේ. කෙසේ වෙතත්, එම වාර්තා අසම්පූර්ණ වියහැකි අතර, ඒ අනුව භව්‍යලෙස නොමගට යොමුකරන සුලුවේ.

3.3.29 මූල්‍ය වාර්තා පිළියෙළ කරනු ලබන්නේ ව්‍යාපාරික සහ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳව සාධාරණ දැනුමක් ඇති සහ තොරතුරු අනලස්ව සමාලෝචනය සහ විශ්ලේෂණය කරන පරිශීලකයන්ටය. ඇතැම්විට මනාලෙස දැනුමැති සහ අනලස් පරිශීලකයනට පවා සංකීර්ණ ආර්ථික සංසිද්ධීන් පිළිබඳව තොරතුරු අවබෝධ කරගැනීමට උපදේශකයකුගේ උදව් ඉල්ලා සිටීමේ අවශ්‍යතාවය ඇතිවිය හැකිය.

**ගුණාත්මක ගති ලක්ෂණ වර්ධනය කිරීම ව්‍යවහාරකරණය**

3.3.30 ගුණාත්මක ගතිලක්ෂණ වර්ධනය කිරීම හැකිතාක්දුරට උපරිම කළ යුතුය. කෙසේ වෙතත්, ගුණාත්මක ගතිලක්ෂණ වර්ධනය තනි තනිව හෝ සමූහයක් වශයෙන් ගත්කළ එම තොරතුරු අදාළ නොවන්නේ නම් හෝ විශ්වාසදායක නොවන ලෙස නියෝජනයවන්නේ නම්, එම තොරතුරු ප්‍රයෝජනවත් ලෙස තැකිය නොහැකිය.

3.3.31 ගුණාත්මක ගති ලක්ෂණ වර්ධනය කිරීම ව්‍යවහාරකරණය නැවත නැවත කිරීමේ ක්‍රියාවලියක් වන අතර, එය නියම කරන ලද පිළිවෙළක් අනුගමනය නොකරයි. සමහර අවස්ථාවලදී" තවත් ගුණාත්මක ගතිලක්ෂණයන් උපරිම කිරීමට, එක ගුණාත්මක ගතිලක්ෂණයන් වර්ධනය කිරීම හීන කළ යුතුවේ. උදාහරණ වශයෙන් අනාගතයට බලපාන පරිදි නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියක් ව්‍යවහාර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, සැසඳිය හැකිබවේ තාවකාලික අඩුවීමක්, දිගුකාලීනව අදාළත්වයේ හෝ විශ්වසනීයනියෝජනයේවර්ධනය කිරීමට වැදගත් විය හැකිය. සංසන්දනයකළ නොහැකි බව සඳහා උචිත හෙළිදරව් කිරීම් අර්ධ වශයෙන් හානිපූර්ණය කෙරේ.

**3.4 ප්‍රයෝජනවත් මූල්‍ය වාර්තාකරණය මත පිරිවැය සංරෝධක**

3.4.1 මූල්‍ය වාර්තාකරණයෙන් ලබාදිය හැකි තොරතුරු මත පිරිවැය පෘථුල සංරෝධකයකි. මූල්‍ය තොරතුරු වාර්තාකරණය පිරිවැය පනවනු ලබන අතර, එම තොරතුරු වාර්තාකරණය මගින් ඒ පිරිවැයෙන් වන ප්‍රතිලාභ සාධාරණීයකරනය වැදගත් වේ. සලකා බැලීම සඳහා විවිධ වර්ගවල පිරිවැයන් සහ ප්‍රතිලාභ ඇත.

3.4.2 මූල්‍ය තොරතුරු සපයන්නන්, මූල්‍ය තොරතුරු රැස්කිරීම ක්‍රියාවලිවලට භාජනය කිරීම, සත්‍යාපනය කිරීම සහ ව්‍යාප්ත කිරීම්වලට අදාලව දැඩි පරිශ්‍රමයක් වැයකරයි. එහෙත් අවසාන වශයෙන් ප්‍රතිලාභවල අඩුවීමක ස්වරූපයෙන් එම පිරිවැය පරිශීලකයන් දරා ගනී. මූල්‍ය තොරතුරු පරිශීලකයන්ද සපයන ලද තොරතුරු විශ්ලේෂණය කිරීම සහ අර්ථ නිරූපණය සඳහා ද පිරිවැයක් දරයි. අවශ්‍ය කරන තොරතුරු සපයා නොමැති නම් එම තොරතුරු වෙනත් තැනකින් ලබාගැනීමට හෝ එය ඇස්තමේන්තු කිරීමට පරිශීලකයනට අමතර පිරිවැයක් දැරීමට සිදුවේ.

3.4.3. නියෝජනය කිරීමට අරමුණු කරගත්, අදාළ සහ විශ්වාසදායක ලෙස නියෝජනයවන මූල්‍ය තොරතුරු වාර්තාකරණය,වැඩි විශ්වාසයකින් යුතුව තීරණ ගැනීමට පරිශීලකයනට උපකාර කරයි. මෙමගින් වන ප්‍රතිඵලය වන්නේ ප්‍රාග්ධන වෙළඳපොළ වඩාත් කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීමත්, සමස්ථයක් වශයෙන් ආර්ථිකය සඳහා ප්‍රාග්ධනයේ පිරිවැය අඩුවීමත්ය. වඩාත් දැනුමැති තීරණ ගැනීම මගින් තනි ආයෝජකයා, ණය දෙන්නෙකු හෝ වෙනත් ණයහිමියකු පවා ප්‍රතිලාභ ලබයි. කෙසේවෙතත් පොදු අරමුණු මූල්‍ය වාර්තාවලට සෑම පරිශීලකයෙකුටම අදාළ ලෙස පෙනෙන සියලු තොරතුරු සැපයීම කළ නොහැකිය.

3.4.4 පිරිවැය සංරෝධක ව්‍යවහාර කිරීමේදී, විශේෂ තොරතුරක් වාර්තා කිරීමෙන් වන ප්‍රතිලාභ එම තොරතුර සැපයීම සහ භාවිතා කිරීමට දරන පිරිවැයසාධාරණීය කළ හැකිද යන්න පිළිබඳව පාලක මණ්ඩලය තක්සේරු කරයි. යෝජිත මූල්‍ය වාර්තාකරන ප්‍රමිතියක් වර්ධනය කිරීමේදී වන පිරිවැය සංරෝධක ව්‍යවහාර කිරීමේදී, එමප්‍රමිතයේ අපේක්ෂිත ස්වභාවය සහ ප්‍රතිලාභවල ප්‍රමාණය සහ පිරිවැයපිළිබඳ තොරතුරු මූල්‍ය තොරතුරු සපයන්නන්ගෙන් පරිශීලකයන්ගෙන්, විගණකවරුන්ගෙන්, විද්වතුන්ගෙන් සහ වෙනත් අයගෙන් පාලක මණ්ඩලය ඉල්ලා සිටී. බොහෝ අවස්ථාවන්හිදී තක්සේරු කිරීම් පදනම් වන්නේ ප්‍රමාණාත්මක සහගුණාත්මක තොරතුරුවල සංයෝජනයකිනි.

3.4.5 ආවේණික වූ විෂයානුබද්ධභාවයනිසා, මූල්‍ය තොරතුරු වල විශේෂ අයිතමයක් වාර්තා කිරීමේදී, වෙනස් පුද්ගලයන්ගේ පිරිවැය සහ ප්‍රතිලාභ පිළිබඳ තක්සේරු වෙනස් වනු ඇත. ඒ අනුව යන්තම්, එක් එක් වාර්තාකරන අස්තිත්වයන් සම්බන්ධයෙන් නොව පිරිවැය සහ ප්‍රතිලාභ පොදුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් සොයා බැලීමට පාලක මණ්ඩලය බලාපොරොත්තු වෙයි. පිරිවැය සහ ප්‍රතිලාභ තක්සේරු කිරීම් සියලු අස්තිත්වයන් සඳහා එකම වාර්තා කිරීමේ අවශ්‍යතා සඳහාසෑමවිටම සාධාරනීය කරණය කෙරේ යන්න එයින් අදහස් නොකෙරේ. අස්තිත්වවල ප්‍රමාණයන්හි වෙනස්කම්, ප්‍රාග්ධනය රැස්කිරීමේ වෙනස් ක්‍රම (ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව) පරිශීලකයන්ගේ වෙනස් අවශ්‍යතා සහ වෙනස් සාධක නිසා වෙනස්කම් උචිත විය හැකිය.

*************

### 3.5 පාදක කරගත් උපකල්පනය

**අඛණ්ඩ පැවැත්ම**

3.5.1 මූල්‍ය ප්‍රකාශන සාමාන්‍යයෙන් පිළියෙළ කරනු ලබන්නේ අස්තිත්වය අඛන්ඩව පවතින බව සහ එහි මෙහෙයුම් පූර්වදෘශ්‍ය අනාගතයක් දක්වා අඛණ්ඩව පවතිනු ඇතැයි යන උපකල්පනය මතය. මේනිසා අස්තිත්වයට එහි මෙහෙයුම් වල පරිමාණය ප්‍රමාණාත්මක ලෙස අඩුකිරීමට හෝ ඇවරකිරීමට අවශ්‍යතාවයක් හෝ අභිප්‍රායක් නොමැතිබව උපකල්පනය කෙරේ. එවැනි අභිප්‍රායක් හෝ අවශ්‍යතාවයක් පවතීනම්, මූල්‍යප්‍රකාශන වෙනස් පදනමක් මත පිළියෙළ කිරීම සිදුවිය හැකි අතර, එසේ වන්නේ නම් භාවිතා කළ පදනම හෙළිදරව් කළ යුතුය.

## 4. ලාසනොස නිශ්චිත විධිවිධාන

පහත දක්වෙන නිශ්චිත විධිවිධාන අදාළ ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිත කට්ටලය හාසම්බන්ධව කියවියයුතු අතර, නිශ්චිත විධිවිධාන දීමේ අරමුණ වන්නේ ලාසනොස වල නිශ්චිත කරුණු සහ ගැලපිළි වෙත යොමු කිරීමටය. හෙළිදරව් කිරීම් ඇතුළුව මෙම ශ්‍රීලනිපප්‍රය සමග අනුකූලවීමට ලාසනොස මගින් සම්පූර්ණයෙන්ම අනුගමනයකළයුතු සහ සහ ලාසනොස විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළයුතු මූලධර්ම, මෙම කොටස නියම කරයි.

පාලක මණ්ඩලය කාලයෙන් කාලයට මෙම අංශයේ වර්ධනයන් ඇමතීමට, අතිරේක නිශ්චිත විධිවිධාන සහ උපදේශ නිකුත් කරනු ඇත. ඒවාද මෙම ශ්‍රීලනිපප්‍රයහි කොටසක් ලෙස සැලකීම අවශ්‍ය වනු ඇත.

4.1 මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග

මූල්‍ය ප්‍රකාශනවල සංරචක

ලාසනොසයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක ඇතුළත් වනුයේ ;

(අ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(ඇ) සංචිත වෙනස් වීමේ ප්‍රකාශනය

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(ඉ) ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සවිස්තර සටහන්

මූල්‍ය ප්‍රකාශනවල සවිස්තරාත්මක සටහන් වල කොටසක් ලෙස ලාසනොස වල පරිපූරක උපලේඛණ සහපදනම් මත හෝ ලබාගත් තොරතුරු සහ එවැනි ප්‍රකාශන සමග කිවයුතු ලෙස අපේක්ෂා කරන තොරතුරුද ඇතුළත් කළ හැකිය.

අදාළ ප්‍රදාන ගිවිසුමෙන් අවශ්‍ය කරන්නේ නම් හැර, පාලක මණ්ඩල/කළමනාකාරීත්වය මගින් වාර්තා, සභාපතිගේ ප්‍රකාශන, කළමනාකාරිත්වයේ සාකච්ඡා සහ විශ්ලේෂණ,සහ ඒ හා සමාන සංස්ථාපිත ආයතනය මූල්‍ය හෝ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කළහැකි අයිතම ඇතුළත් නොවේ.

4.2 **සමුච්චිත අරමුදල**

***සීමා නොකරන ලද අරමුදල (ප්‍රාග්ධනය)***

සීමා නොකරන ලද අරමුදල ලාසනොස හි සිය ප්‍රාග්ධනයේ සමකයන් වන අතර මූල්‍ය ප්‍රකාශනවල සීමා කරන ලද අරමුදල්වලින් වෙන් ව ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, නිම කරනලද ව්‍යාපෘති සම්බන්ධයෙන් සීමා කරන ලද අරමුදල් වල යම් අතිරික්තයන්, අදාල කොන්ත්‍රාත්තුව හෝ ගිවිසුම මගින් අවසර දී ඇතිනම් පමණක් සීමා නොකරන ලද අරමුදලට ඇතුළත් කිරීම සඳහා එය ද මාරු කළ හැකිය.

***සීමාකරන ලද අරමුදල***

සීමාකරන ලද අරමුදල් "වියදම් නොකළ ප්‍රදාන" ලෙස ද හඳුන්වනු ලැබේ. එය ලාසනොස වල සීමා කරනලද ශුද්ධ වත්කම් වල කොටසක් නියෝජනය කරයි.

***මැනීම සහ හඳුනාගැනීම***

සීමාකරනලද අරමුදල් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කළ යුත්තේ ඒවා ලැබුණ අවස්ථාවේදීය. එනම් මුදල් වශයෙන් හෝ බැංකු ගිණුමට තැන්පත් කළ අවස්ථාවේදී හෝ එය ලැබෙන බවට සාධාරණ සහතිකවීමක් ඇති අවස්ථාවේදීය.

***හෙළිදරව් කිරීම***

පහත සඳහන් දෑ හෙළි කළ යුතුය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමේ ක්‍රමද ඇතුලුව සීමාකරන ලද අරමුදල් සහ සීමානොකරන ලද අරමුදල් සඳහා තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් සීමා කරනලද දායකවීම් වල ස්වභාවය සහ ප්‍රමාණය සහ සංවිධානය සෘජුව ප්‍රතිලාභ ලැබූ වෙනත් ස්වරූපයේ උදව් කිරීම් පිළිබඳව ඇඟවීමක්, සහ

(ඇ) හඳුනාගත් උදව් කිරීම්වලට ඈඳුන ඉටු නොකරන ලද කොන්දේසි සහ අසම්භාව්‍යයන්.

4.3 **අයභාර/ප්‍රදානයන් හඳුනාගැනීම**

4.3.1 (අ) සීමා කරන ලද අයභාර සහ

(ආ) සීමා නොකරන ලද අයභාර

අතර වෙනස ලාසනොස වෙන්කොට හඳුනාගෙන සහ ලැබුන හෝ ලැබියයුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට සෑම එකක්ම මැනිය යුතුය.

4.3.2 (අ) සීමාකරන ලද සහ (ආ) සීමා නොකරන ලද අයභාර හඳුනාගැනීම සඳහා වෙනස් ප්‍රවේශයන් භාවිතා කරනු ලැබේ.

***සීමා කරන ලද අයභාරය***

4.3.3 සීමා කරන ලද දායකවීම් නිර් මූල්‍යයන් (නොමිලේ දෙන්නක්) නොවේ. ඒවා අරමුදල් ලැබීම සඳහා සේවාවක හෝ වෙනත් ක්‍රියාවලියක කාර්යසාධන කොන්දේසි ඇඳුන ගිවිසුම්, කොන්ත්‍රාත් හෝ වෙනත් සම්මුති මත පදනම් වූ ඒවාවේ. ලාසනොස දායකවීම් උපයන්නේ අවධාරණය කරනලද කොන්දේසි සමග අනුකුලවීමෙන් සහ අපේක්ෂා කළ බැඳීම් ඉටු කිරීමෙනි. එමනිසා දායකවීමේ ලැබෙනු ඇතැයි සාධාරණ සහතිකවීමක් ඇතිවනතුරු සහ ඒවා ලැබීමට නියමකර ඇති කොන්දේසි සමග අනුකුළ වනතුරු, අයභාරය විස්තීර්ණ අදායම් ප්‍රකාශනයේ හඳුනා නොගත යුතුය.

4.3.4 ඉහත දායකවීම්වලට කරන ලද සීමා කිරීම්වලට යටත්ව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගන්නා විට ඒවා ක්‍රමානුකුල පදනමක් මත හානිපූර්ණය කිරීමට අපේක්ෂා කරන සම්බන්ධිත පිරිවැයට එරෙහිව ගැලපිය යුතුය. සඵල වශයෙන් එවැනි දායකවීම් හඳුනාගත යුත්තේ එම ලාසනොස අදාළ සේවය හෝ කාර්යසාධනය සපයා ඇති ප්‍රමාණයට පමණි.

4.3.5 යම් සීමාකරන ලද දායකවීම් ලැබීමේදී, උදා. බැංකු තැන්පත් ලෙස දායකත්වය මූල්‍යතත්ත්ව ප්‍රකාශනයේ සීමා කරන ලද අරමුදල් ගිණුමට බැරකළ යුතු අතර, බැංකු ගිණුමට හරකළ යුතුය. ඉන් අනතුරුව, ක්‍රමානුකුල පදනමක් මත, (උදාඃ සෑම මාසයක් අවසානයේදී) මාසයක් තුළ එකඟ වූ "සීමා කරන ලද" ක්‍රියාකාරකම් සඳහා වියදම් කළමුදලට සමාන ප්‍රමාණයක්, ආදායමට ගත යුතුය. මෙය කරනුයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සීමාකරන ලද අරමුදල් ගිණුම හරකර, සීමාකරන ලද ආදායම් ගිණුම බැර කිරීමෙනි.

4.3.6 මෙම පිළිවෙත අනුගමනය කිරීමෙන් ඕනෑම විශේෂ ගනුදෙනුවක සීමා කරනලද ආදායම සහ ඍජු ව්‍යාපෘති වියදම්වල ශුද්ධ ප්‍රතිඵලය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි සාමාන්‍යයෙන් ශුන්‍ය("0") වීමයි. ඒ අනුව ශුන්‍යයට වැඩි හෝ අඩු ඕනෑමවටිනාකමක් වෙනත් මාතෘකාවල ප්‍රතිඵල පිළිබිඹු කරයි. එනම්, ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට නොඇඳුන, සීමා නොකරන ලද ආදායම් හෝ වියදම් හෝ එවැනි අතිරික්තයන් සීමා නොකරන ලද අයභාරයට මාරු කිරීමට ප්‍රදානය කරන්නා අවසරදී ඇත්නම්, සීමා කරනලද අරමුදලක ඉතිරිව ඇතියම් අතිරික්තයකි.

***සීමා නොකරන ලද අයභාර***

4.3.7 පොදුසීමා නොකරනලද සම්පත් වලින් පැන නගින අයභාර, ව්‍යාපාර අස්තිත්ව වල, සමාන අයභාරයන්හි ගතිලක්ෂණ ඇති බැවින් ඒ අනුව කටයුතු කළ යුතුය. එය හඳුනාගත යුත්තේ, අයභාරයේ වටිනාකම විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් හෝ ගනුදෙනුවට ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභලාසනොසයට ගලාඒම භව්‍යනම්පමණි. ඒ අනුව, සාමාජික ගාස්තු, විවිධ ප්‍රදාන, උපදේශන ගාස්තු භාණ්ඩ විකිණීම හෝ වෙනත් සීමා නොකරන ලද ආදායම් මූලාශ්‍ර මගින් උත්පාදනය වියහැකි ප්‍රතිෂ්ඨාවේ වටිනාකම් සම්බන්ධයෙන් සැලකිය යුතු අන්දමේ අනියතතා එම අවස්ථාවේ නොපැවතීම.

4.3.8 ලාසනොසයක විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සැලසුම් කර ඇත්තේ, ව්‍යාපාර සංවිධානයක ලාභ හා අලාභ ගිණුමේ දක්නට ලැබෙන සියලු ප්‍රතිලාභ සහ අලාභ ඇතුළත් වන ලෙසය.

4.4 **තොග**

ප්‍රතිලාභීන් වෙනුවෙන් මිලදීගත් හෝ පරිත්‍යාග කරන ලද තොග

4.4.1 ඒවා පිරිවැයක් නොමැතිව (නොමිලේ) හෝ නාමික වටිනාකමකට ප්‍රතිලාභීන් අතර බෙදාදීමේ අරමුණ ඇතිව ලාසනොස තොග අයිතම නිෂ්පාදනය කිරීම හෝ මිලදී ගතහැකි ය. එවැනි අයිතම විකිණීමේ අරමුණ, හෝ නිෂ්පාදන ක්‍රියාවලියේදී

පරිභෝජනය, හෝ සේවා සැපයීම හෝ වෙනත් වාණිජ, කාර්මික හෝ ව්‍යාපාර ස්වභාවයේ අරමුණු සඳහා රඳවාගෙන තබාගන්නේ නොමැති වූයේ වුවද මෙම ශ්‍රීලනිපප්‍රයේ අරමුණ සඳහා එවැනි අයිතම තොගලෙස සැලකිය යුතුය.

4.4.2 ප්‍රතිලාභීන් අතර බෙදාදීමට හෝ ඒවා විකිණීමෙන් වනලද මනාව ප්‍රතිලාභීන්ගේ යහපත සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස යම් විශේෂ අවස්ථාවකදී පරිත්‍යාග වශයෙන් ලාසනොසයකට අයිතම ලැබෙනු ඇත. එවැනි අවස්ථාවකදී ලැබුණ අයිතම සඳහා වටිනාකමක් ව්‍යවහාර කිරීම කළ හැකි නොවේ. ඒ අනුව පරිත්‍යාග වශයෙන් ලැබූ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දින රඳවාගෙන ඇති අයිතම ලැයිස්තු ගතකර ප්‍රමාණීයකරණය කළ යුතුය.

4.5 ආදායම් බදු

*සමුච්චිත අරමුදලට සෘජුවම හර කරන ලද හෝ අයකරන ලද අයිතමයන්*

4.5.1 එම හෝ වෙනත් කාල පරිච්ඡේදයකදී එවැනි අරමුදල් ගිණුමකට සෘජුව බැර කරනලද හෝ අයකරනලද අයිතම වලට බදු සම්බන්ධිත නම් ප්‍රවර්තන බදු අදාළ අරමුදල් ගිණුමට සෘජුව අය කිරීම හෝ බැර කිරීම කළ යුතුය.

*බදු වියදම් (ආදායම්)*

4.5.2 බදු වියදම (ආදායම) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ මුහුණත ඉදිරිපත් කළ යුතුය.

4.6 **දේපල, පිරියත සහ උපකරණ**

**ඉඩම්**

4.6.1 ලාසනොසයක් පහත දක්වෙන පරිදි විවිධ ක්‍රම මගින් ඉඩම් අත්පත් කරගත හැකිය ;

(අ) රජය විසින් විධිමත්ව සකස් කළ අත්‍යාවශ්‍ය අත්පත් කරගැනීමේයෝජනාක්‍රමයක් හරහා ඇතුළුව, ඉඩම් හිමිකරුවන්ගෙන් මිලදී ගැනීමේ මාර්ග මගින් ;

(ආ) ඒවායේ භාවිතයට කිසියම් කොන්දේසි ඇතිව හෝ නැතිව ලාසනොස සඳහා ආයතන හෝ තනි පුද්ගලයන් විසින් ත්‍යාග කරනලද ඉඩම් ;

(ඇ) ඒවායේ භාවිතයට කිසියම් කොන්දේසි ඇතිව හෝ නැතිව ලාසනොස සඳහා රජය විසින් ලබාදෙන ලද ඉඩම් ;

(ඇ) හිමිකමේ අයිතියක් නොමැති එවැනි ලාසනොස හුදුභාරකරුවෙක් ලෙස ක්‍රියාකරන ඉඩම් ද ලාසනොස වෙත පවරා තිබිය හැකිය.

4.6.2 ඉහත සඳහන් ක්‍රම හරහා අත්පත් කරගත් ඉඩම් සඳහා ගිණුම්කරණ ආකාරය පහත සඳහන් පරිදි වියහැකිය ;

(අ) **මිලදී ගැනීම හරහා අත්පත් කරගත් ඉඩම්**

- ගෙවූ හෝ /ගෙවියයුතු මිලදී ගැනීමේ මිල, අත්පත් කරගැනීමට ආනුශංගික ලියාපදිංචි කිරීමේ ගාස්තු වැනි වෙනත් පිරිවැය වල සමාහාරයකට එවැනි ඉඩම් වාර්තා කළ යුතුය.
- අනිවාර්ය අත්පත් කරගැනීමේ යෝජනා ක්‍රමයකදී, අත්කරගත් ඉඩමක් පිළිබඳව ලාසනොස සහ ඉඩම අත්පත්කරගැනීමට කලින් අයිතිකරු අතර මතභේදයක් ඇති අවස්ථාවක, මූල්‍ය ප්‍රකාශන අරමුණ සඳහා ඉඩමේ පිරිවැය නිර්ණය කිරීමේදී වන්දි අනුපාතිකය සම්බන්ධයෙන් ගෙවීමට සිදුවිය හැකි උචිත ප්‍රමාණයක්, අතිරේක වන්දි වශයෙන් පහත සඳහන් කොන්දේසි සපුරාලන්නේ නම් පමණක් ඇතුළත් කළ යුතුය.

  (i) අතිරේක වන්දි ගෙවීම භව්‍ය වීම, සහ

  (ii) එසේ ගෙවියයුතු වටිනාකම සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ හැකිවීම.

*ආ. පිරිවැයක් නොමැතිව අත්පත් කරගත් ඉඩම්*

- සමහර අවස්ථාවලදී ලාසනොස සඳහා රජය පිරිවැයක් නොමැතිව ඉඩමක් ලබාදිය හැකිය. පාසැල් තැනීම, උද්‍යාන තැනීම හා සමාන පොදුපහසුකම් ආදිය සඳහා තනි පුද්ගලයන් හෝ ආයතන උරුම කර දීම මගින් ඉඩමක් ලබාදිය හැකිය. එවැනි ඉඩමක ලාසනොසට වන පිරිවැය ශූන්‍යවේ. හරයක් වශයෙන්, ලැබුණ එවැනි ඉඩම මූල්‍ය නොවන ප්‍රදානයක් වන අතර, ප්‍රදානය සහ වත්කම යන දෙකම සාධාරණ අගයට ගිණුම්ගත කළයුතුය. සමහර අවස්ථාවල අනුගමනය කරන විකල්ප ක්‍රියා මාර්ගයක් වන්නේ වත්කම සහ ප්‍රදානය යන දෙකම නාමික වටිනාකමකට වාර්තා කිරීමයි. කෙසේ වෙතත් නිසි පාලනයන් පවත්වාගෙන යාමට හැකිවීම පිණිස එවැනි ඉඩම් ස්ථාවර වත්කම් ලේඛණයේ සඳහන් කළයුතු අතර එහි භාවිතය සඳහා පනවා ඇති යම් කොන්දේසි ඇතුළුව මූල්‍ය ප්‍රකාශන වල සටහන් තුළ හෙළිදරව් කළ යුතුය.

- අත්පත් කරගැනීමේදී ලියාපදිංචි කිරීමේ ගාස්තු වැනි ආනුශංගික වියදම් ඉහත දැට එකතු කළ යුතුය.

*ඇ. පවරාගත් රජයේ ඉඩම්*

- එවැනි ඉඩමක් ලාසනොසයකට අයිති නොවන්නාක් මෙන්ම එවැනි ඉඩමක් භාවිත කිරීමෙන් වන ආර්ථික ලාභ ලාසනොස වෙත ගලා එන්නේද නැත. හිමිකාරිත්වය රජය වෙත රඳවාගෙන ඇති අතර, ලාසනොස එම ඉඩම සම්බන්ධයෙන් හුදු භාරකාරයෙක් වශයෙන් ක්‍රියාකරයි. එබැවින් එවැනි ඉඩම්ලාසනොසයේවත්කම් ලෙස සලකනු නොලැබේ.

*උපචිත පදනම ගිණුම්කරණයට මාරුවන අවස්ථාවේදී ආරම්භක ශේෂය*

4.6.3 අස්තිත්වය එහි සියලු පිරියත දේපළ හා උපකරන වාර්තාකර නොමැති නම්, මෙම ශ්‍රීලනිපප්‍රය පරිදි උපචිත ගිණුම්කරණයට ලාසනොසයක් මාරු වන අවස්ථාවේදී එවැනි අයිතම ගිණුම්කරණය පිළිබඳව ගැටලුවලට මුහුණ පෑ හැකිය. උදාහරණයක් වශයෙන් පරිත්‍යාග හෝ උරුමකරදීම වැනි මාර්ග වලින් ලැබුණ දේපළ, පිරියත සහ උපකරණ ඒවා අත්පත් කරගත් අවස්ථාවේදී වාර්තා කර නොතැබිය හැකිය. එමෙන්ම, සීමාකරන ලද අරමුදල් හරහා ව්‍යාපෘති වියදම් වල කොටසක් ලෙස අත්පත් කරගත් අයිතම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ලියාහැර තිබීමට පුලුවන. එවැනි වත්කම් හඳුනාගෙන ඒවා උචිත පරිදි ගිණුම්ගත කිරීම අවශ්‍යවියහැකිය. එවැනි වත්කම් ගිණුම්කරණයේදී, අසතුටුදායක අයිතිය, හිමිකමේ දෝෂවැනි සාධක සලකා බැලීම ද අවශ්‍ය වේ.

*ප්‍රදාන, උරුම කරදීම හෝ ප්‍රදාන හරහා ලැබුන දේපළ, පිරියත සහ උපකරණ*

4.6.4 ප්‍රදානයක් හෝ උරුම කරදීමක් වශයෙන් සෘජුව ලැබුන දේපළ පිරියත සහ උපකරණ සාධාරණ අගයට දේපළ, පිරියත සහ උපකරණ ගිණුමට හර කළයුතු අතර, අනුරූප වටිනාකම විලම්භිත ආදායම් ගිණුමට බැර කළ යුතුය. ඉන්පසුව එවැනි අයිතම මෙම ශ්‍රීලනිපප්‍රය ප්‍රකාරව ක්ෂය කළයුතු අතර, අනුරූප වටිනාකම විලම්භිත ආදායම් ගිණුමෙන් මූල්‍ය තත්ත්වය දක්වෙන ප්‍රකාශනයේ විස්තීර්ණ ආදායම් ගිණුමට මාරු කළ යුතුය. මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ විලම්භිත ආදායම, වත්කමේ ශුද්ධ පොත් අගයෙන් අඩුකළ යුතු අතර, ඒ අනුව වත්කමේ ධාරණ අගය ශූන්‍යවේ.

4.6.5 ලාසනොස ප්‍රයෝජනය සඳහා ප්‍රදානයකින් අරමුදල් කරන ලද ව්‍යාපෘතියකින් මිලදී ගත් යම් අයිතම සහ එම අයිතම වල වටිනාකම, අදාළ ව්‍යාපෘති ගිණුමට අයකර ඇතිවිට, එම අයිතම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ යටතේ ඇතුළත් කර ඇති ඕනෑම අයිතමයක් පිළිබඳව සලසා ඇති වර්ගීකරණය හා සමවන වර්ගීකරණයන් පරිදි මූල්‍ය ප්‍රකාශන වල සටහනක් ලෙස හෙළිදරව් කළ යුතුය.

4.6.6 ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු ව්‍යාපෘතියේ වත්කම් රඳවාගෙන 4.6.4 ඡේදය පරිදි හෙළිදරව් කළ විට, සංවිධානය රඳවාගත යුතු දේපළ, පිරියත සහ උපකරණ එම අයිතමයන් සංවිධානයේ ගිණුම් පොත්වලට සාධාරණ අගයට ප්‍රාග්ධන සංචිතයක් හරහා ගෙන ආ හැකිය. එවිට, එවැනි වත්කම් සඳහා ප්‍රතිපාදනය කළ ක්ෂය කිරීම් ප්‍රාග්ධන සංචිතයට එරෙහිව අයකරනු ලැබේ. අදාළ ප්‍රතිලාභීන්ට භාරදුන් හෝ ප්‍රදානය කරන්නාට ආපසු භාරදුන් අයිතමයන් සඳහා ව්‍යාපෘතිය අවසානයේදී උචිත හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන වල කළ යුතුය.

5. බලාත්මක දිනය

5.1 ලාභ සඳහා නොවන සංවිධාන සඳහා (රාජ්‍ය නොවන සංවිධාන ඇතුළුව) වන නිර්දේශිත ශ්‍රී ලංකා පරිචය ප්‍රකාශය (ශ්‍රීලනිපප්‍රය - ලාසනොස (රාසනොස ඇතුළුව) 2012 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ආරම්භවන කාල පරිච්ඡේදවලින් ආවරණය වන මූල්‍ය ප්‍රකාශන සඳහා බල පැවැත්වේ. 2012 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ආරම්භ වන හෝ කාල

පරිච්ඡේදයන්ට වන මූල්‍ය ප්‍රකාශන සඳහා මෙම ශ්‍රීලනිපප්‍රය - ව්‍යාවහාර කිරීම නිර්දේශ කිරීම හා උනන්දු කිරීම කරන අතර 2013 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ආරම්භ කරන කාලපරිච්ඡේදයන්ට වන මූල්‍ය ප්‍රකාශන සඳහා මෙම ශ්‍රීලනිපප්‍රය ව්‍යවහාර කිරීම අනිවාර්ය වේ.

5.2 ශ්‍රී ලංකා වග මගින් 2006 අප්‍රේල් 1 දින සිට බලාත්මක වන පරිදි 2005 දී නිකුත් කළ ශ්‍රීලනිපප්‍රය මෙම ශ්‍රීලනිපප්‍රය මගින් අවලංගු කෙරේ.

**පරිශිෂ්ඨය**

**නිදර්ශනාත්මක මූල්‍ය ප්‍රකාශන ව්‍යුහය**

මෙම පරිශිෂ්ඨය නිදර්ශනාත්මක පමණක් වන අතර, ශ්‍රීලනිපප්‍රයේ කොටසක ස්වරූපය නොගනී. මෙම පරිශිෂ්ඨයේ අරමුණ වනුයේ ශ්‍රීලනිපප්‍රයේ මූලධර්ම ව්‍යවහාර කරනයේදී ඒවායේ තේරුම පැහැදිලි කිරීමට උදව්වීමට නිදර්ශන දැක්වීමය. නිදර්ශනාත්මක මූල්‍ය ප්‍රකාශන පදනම් වී ඇත්තේ සම්පූර්ණ SLFRSs පදනම් කරගෙනය.

මෙම ශ්‍රීලනිපප්‍රය, මූල්‍ය ප්‍රකාශන වල සංරචකයන් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සංචිතවල වෙනස්වීම් ප්‍රකාශනය මෙන්ම මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යන ඒවායේ මුහුණතේ හෙළිදරව් කළයුතු අවම අවශ්‍යතාවයන් නියම කරයි. මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් හා එක්ව පවතී. මෙම පරිශිෂ්ඨයේ අරමුණ වන්නේ, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කිරීම සඳහා වන ආකාර, ප්‍රාථමික මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ හැකි අන්දම පිළිබඳ උදාහරණ සැපයීමය. එක් එක් සංවිධානයේ තත්ත්වයන් අනුව සාධාරණ ඉදිරිපත් කිරීමක් මුදුන්පත් කරගැනීම නිසි ලෙස සපුරාගැනීමට අවශ්‍ය වනපරිදි, ඉදිරිපත් කිරීමේ අනුපිළිවෙළ, පේලි අයිතම සඳහා භාවිත කළ විස්තර කිරීම අවශ්‍ය වූ කල්හි වෙනස් විය යුතුය.

**ඒබීසී ශ්‍රී ලංකා**
**2013 මාර්තු 31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| [රු. දහස් වලින්] | **සටහන්** | **සංවිධානය** | |
|---|---|---|---|
| මාර්තු 31 දිනට | | 2013 | 2012 |
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 4.1 | xxxx | xxxx |
| අස්පෘශ්‍ය වත්කම් | 4.2 | xxxx | xxxx |
| දිගුකාලීන ලැබියයුතු දෑ | 4.3 | xxxx | xxxx |
| වෙනත් මූල්‍ය වත්කම් | 4.4 | xxxx | xxxx |
| **ජංගම නොවන වත්කම් - එකතුව** | | xxxx | xxxx |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 4.5 | xxxx | xxxx |
| ලැබියයුතු ගිණුම් | 4.6 | xxxx | xxxx |
| පෙරගෙවුම් | 4.7 | xxxx | xxxx |
| වෙනත් මූල්‍ය වත්කම් | 4.8 | xxxx | xxxx |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 4.9 | xxxx | xxxx |
| **ජංගම වත්කම් - එකතුව** | | xxxx | xxxx |
| **වත්කම් එකතුව** | | xxxx | xxxx |
| **වගකීම් සහ සංචිත** | | | |
| **සමුච්චිත සංචිත** | | | |
| සීමා නොකරනලද අරමුදල් | 4.10 | xxxx | xxxx |
| නම් කරනලද අරමුදල් | 4.11 | xxxx | xxxx |
| සීමා කරනලද අරමුදල් | 4.12 | xxxx | xxxx |
| නිත්‍ය ආදායම් අරමුදල | 4.13 | xxxx | xxxx |
| වෙනත් ප්‍රාග්ධන සංචිත | 4.14 | xxxx | xxxx |
| **සමුච්චිත සංචිත - එකතුව** | | xxxx | xxxx |
| **ජංගම නොවන වත්කම්** | | | |

**ඒබීසී ශ්‍රී ලංකා**
**2013 මාර්තු 31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| **[රු. දහස් වලින්]** | **සටහන්** | **සංවිධානය** | |
|---|---|---|---|
| මාර්තු 31 දිනට | | 2013 | 2012 |
| ණය සහ ණයට ගැනීම් | 4.15 | ×××× | ×××× |
| සේවක ප්‍රතිලාභ වගකීම් | 4.16 | ×××× | ×××× |
| විලම්භිත ආදායම් | 4.17 | ×××× | ×××× |
| **ජංගම නොවන වත්කම් - එකතුව** | | ×××× | ×××× |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ගිණුම් | 4.18 | ×××× | ×××× |
| උපචිත වියදම් | 4.19 | ×××× | ×××× |
| ණය සහ ණයට ගැනීම් | 4.15 | ×××× | ×××× |
| ප්‍රතිපාදන | 4.20 | ×××× | ×××× |
| බැංකු අයිරාවන් | 4.21 | ×××× | ×××× |
| **ජංගම වගකීම් එකතුව** | | ×××× | ×××× |
| **වගකීම් - එකතුව** | | ×××× | ×××× |
| **වගකීම් සහ සංචිත එකතුව** | | ×××× | ×××× |

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය/භාරකරුවන් වගකීම දරනු ලබයි.

මෙම මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 20×× ××× ×× දින අධ්‍යක්‍ෂ මණ්ඩලය/භාරකරුවන් අනුමත කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන[1] සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙළ කර ඇති බව සහතික කරමි.

අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන්

| 20×× ××× ×× දින | ........................... | ........................... | ........................... |
|---|---|---|---|
| | අධ්‍යක්‍ෂ | අධ්‍යක්‍ෂ | මූල්‍ය - ප්‍රධාන |

පිටු .......... සිට ............ දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

**ඒබීසී ශ්‍රී ලංකා**
**2013 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා**
**විස්තීරණ ආදායම් ප්‍රකාශනය**
(රු. දහස් වලින්)

| | සටහන් | ආයතනය | |
|---|---|---|---|
| මාර්තු 31 න් අවසන් වූ වසර | | 2013 | 2012 |
| **මෙහෙයුම් ආදායම්** | | | |
| ආදායම් මූලාශ්‍ර | 4.22 | ×××× | ×××× |
| **මෙහෙයුම් ආදායම් එකතුව** | | ×××× | ×××× |
| **මෙහෙයුම් වියදම්** | | | |
| සේවක මණ්ඩල සම්බන්ධිත වියදම් | 4.23 | ×××× | ×××× |
| ඍජු ව්‍යාපෘති/ක්‍රියාකාරකම් පිරිවැය | 4.24 | ×××× | ×××× |
| කුලී | 4.25 | ×××× | ×××× |
| භාණ්ඩ හා ද්‍රව්‍ය මිලදී ගැනීම් | | ×××× | ×××× |
| ක්ෂය කිරීම | | ×××× | ×××× |

1. අදාළ වන්නේ නම් පමණක්

**ඒබීසී ශ්‍රී ලංකා**
**2013 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා**
**විස්තීරණ ආදායම් ප්‍රකාශනය**
(රු. දහස් වලින්)

| මාර්තු 31 න් අවසන් වූ වසර | සටහන් | ආයතනය 2013 | ආයතනය 2012 |
|---|---|---|---|
| පොදු වියදම් | | xxxx | xxxx |
| මෙහෙයුම් වියදම් එකතුව | | xxxx | xxxx |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ අතිරික්තය/(ඌණතාවය)** | | xxxx | xxxx |
| **වෙනත් ආදායම්** | | | |
| ශුද්ධ මූල්‍ය ආදායම් | 4.26 | xxxx | xxxx |
| වෙනත් ආදායම් | | xxxx | xxxx |
| **වෙනත් ආදායම් එකතුව** | | xxxx | xxxx |
| **වෙනත් වියදම්** | | | |
| විදේශ විනිමය පාඩු (ශුද්ධ) | | xxxx | xxxx |
| වෙනත් වියදම් | | xxxx | xxxx |
| **වෙනත් වියදම් එකතුව** | | xxxx | xxxx |
| **මෙහෙයුම් නොවන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ අතිරික්තය/(ඌණතාවය)** | | xxxx | xxxx |
| **බදුවලට පෙර ශුද්ධ අතිරික්තය/(ඌණතාවය)** | | xxxx | xxxx |
| ආදායම් බදු වියදම | 4.27 | xxxx | xxxx |
| **වර්ෂය සඳහා අතිරික්තය/(ඌණතාවය)** | | xxxx | xxxx |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | | |
| නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් මත ආයු ගණක ප්‍රතිලාභ/(අලාභ) | 4.11 | xxxx | xxxx |
| විදේශ මෙහෙයුම් පරිවර්තනයේදී විනිමය වෙනස්වීම් | | xxxx | xxxx |
| දේපළ ප්‍රත්‍යාගණන මත ප්‍රතිලාභ | | xxxx | xxxx |
| මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් | | xxxx | xxxx |
| විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස | | xxxx | xxxx |
| වෙනත් විස්තීර්ණ ආදායමේ සංරචකවලට සම්බන්ධිත ආදායම් බදු | | (xxx) | (xxx) |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් වල එකතුව** | | xxxx | xxxx |
| **වර්ෂය සඳහා විස්තීර්ණ ආදායමේ එකතුව** | | xxxx | xxxx |
| **වර්ෂය සඳහා වන විස්තීර්ණ ආදායමේ එකතුව වෙන් කිරීම** | | | |
| සංචිත සඳහා වෙන් කිරීම | | xxxx | xxxx |
| නිත්‍ය ආදායම් අරමුදලට වෙන් කිරීම | | xxxx | xxxx |

පිටු .......... සිට .............. දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.

**ඒබීසී ශ්‍රී ලංකා**
**2013 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා**
**සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය**
(රු. දහස් වලින්)

| විස්තරය | සීමාකරන ලද සංචිත | සීමා නොකළ සංචිත | නිත්‍ය ආදා--යම් අරමුදල | ප්‍රාග්ධන සංචිත | වර්ෂයේ ප්‍රතිඵල | එකතුව |
|---|---|---|---|---|---|---|
| **2011 අප්‍රේල් 1 දින ශේෂය** | xxxx | xxxx | xxxx | xxxx | xxxx | xxxx |
| වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌණතාව) | | | | | xxxx | xxxx |
| වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් | | | | | xxxx | xxxx |
| **සංචිතවලට/වලින් මාරුකිරීමට පෙර ශේෂය** | xxxx | xxxx | xxxx | xxxx | xxxx | xxxx |
| ප්‍රතිඵලය සංචිත වලට වෙන්කිරීම | xxxx | xxxx | | | (xxx) | xxxx |
| ප්‍රතිඵලය නිත්‍ය ආදායම අරමුදලට වෙන් කිරීම | | | xxxx | | (xxx) | xxxx |
| නිශ්චිත මෙහෙයුම් සඳහා ප්‍රදානය කරන්නන්ගේ සීමාකරන ලද දායකවීම් වැඩිවීම/අඩුවීම (සටහන 4.12) | (xxx) | | | | xxxx | xxxx |
| **2012 මාර්තු 31 දින ශේෂය** | xxxx | xxxx | xxxx | xxxx | xxxx | xxxx |
| වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(ඌණතාවය) | | | | | xxxx | xxxx |
| වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් | | | | | xxxx | xxxx |
| **සංචිතවලට / වලින් මාරු කිරීමට පෙර ශේෂය** | xxxx | xxxx | xxxx | xxxx | xxxx | xxxx |
| ප්‍රතිඵල සංචිතවලට වෙන් කිරීම | xxxx | xxxx | | | (xxx) | xxxx |
| නිත්‍ය අරමුදලට ප්‍රතිඵල වෙන්කිරීම | | | xxxx | | (xxx) | xxxx |
| නිශ්චිත මෙහෙයුම් සඳහා ප්‍රදානය කරන්නන්ගේ සීමාකරන ලද දායකවීම් වැඩිවීම/අඩුවීම (සටහන 4.12) | (xxx) | | | | xxxx | xxxx |
| **2013 මාර්තු 31 දින ශේෂය** | xxxx | xxxx | xxxx | xxxx | xxxx | xxxx |

පිටු ......... සිට ......... දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.

**ඒබීසී ශ්‍රී ලංකා**
**2013 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

(රුපියල් දහස් වලින්)

| | සංවිධානය | |
|---|---|---|
| **මාර්තු 31 න් අවසන් වර්ෂය** | **2013** | 2012 |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහ** | | |
| වර්ෂය සඳහා (බදුවලට පෙර) අතිරික්තය / (ඌණතාවය) | xxxx | xxxx |
| ශුද්ධ මුදල් ප්‍රවාහ අතිරික්තය/(ඌණතාවය) සැසඳීමට ගැලපිලි | | |
| මූල්‍ය නොවන අයිතම | | |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය සහ හානිකරණය | xxxx | xxxx |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය සහ හානිකරණය | xxxx | xxxx |
| තොග සඳහා හානිවීම සහ ප්‍රතිපාදන | xxxx | xxxx |
| ප්‍රතිපාදන, ලැබිය යුතු දෑ සහ නිශ්චිත අවදානම්වල සංචලනය | xxxx | xxxx |
| පොලී සහ සුරැකුම් ආදායම | (xxx) | (xxx) |
| සුරැකුම්වලින් ප්‍රතිලාභ/(අවාසි) | (xxx) | (xxx) |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් වන ප්‍රතිලාභ | (xxx) | (xxx) |
| | | |
| **කාරක ප්‍රාග්ධන ගැලපුම්** | | |
| ලැබියයුතු ගිණුම් | (xxx) | (xxx) |
| පෙර ගෙවීම් | xxxx | xxxx |
| තොග | xxxx | xxxx |
| වෙනත් මූල්‍ය වත්කම් | (xxx) | (xxx) |
| ගෙවිය යුතු ගිණුම් | xxxx | xxxx |
| උපචිත වියදම් සහ විලම්භිත ආදායම් | (xxx) | (xxx) |
| වෙනත් මූල්‍යමය වගකීම් | xxxx | xxxx |
| | | |
| අඩුකළා: | | |
| ගෙවූ ආදායම් බදු | (xxx) | (xxx) |
| ගෙවූ පොලී | - | - |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබූ (භාවිත කළ) ශුද්ධ මුදල්** | xxxx | xxxx |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම් | (xxx) | (xxx) |
| අස්පෘශ්‍ය වත්කම් මිලට ගැනීම | (xxx) | (xxx) |
| උපකරණ විකිණීමෙන් ලද මනාව | xxxx | xxxx |
| සුරැකුම්පත් මිලට ගැනීම | (xxx) | (xxx) |
| ලැබුණ පොලී | xxxx | xxxx |
| සුරැකුම්පත් වලින් ආදායම්, ශුද්ධ | xxxx | xxxx |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබූ (භාවිත කළ) ශුද්ධ මුදල්** | xxxx | xxxx |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ** | | |
| රාජ්‍ය ණය ගැනීම් | xxxx | xxxx |
| රාජ්‍ය ණය ගෙවීම් | (xxx) | (xxx) |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබූ (භාවිත කළ) ශුද්ධ මුදල් | xxxx | xxxx |
| | | |
| **මුදල් හා මුදල් හා සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | xxxx | xxxx |
| **අප්‍රේල් 1 දින මුදල් සහ මුදල් හා සමාන දෑ** | xxxx | xxxx |
| **මාර්තු 31 දී මුදල් සහ මුදල් හා සමාන දෑ** | xxxx | xxxx |

පිටු ......... සිට ........ දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.

**ඒබීසී ශ්‍රී ලංකා**
2013 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

1. **පොදු තොරතුරු**

ලාභ සඳහා නොවන සංවිධාන සඳහා (රාජ්‍ය නොවන සංවිධාන ඇතුළුව) ශ්‍රී ලංකා නිර්දේශිත පරිචය ප්‍රකාශනයෙහි සපයන ලද නිර්වචනය පරිදි ඒබීසී ශ්‍රී ලංකා රාජ්‍ය නොවන සංවිධානයකි.

(එය අංක .......... දරන සමාජ සේවා පනත යටතේ පිහිටුවන ලද සමාජ සේවා දෙපාර්තමේන්තුව සමග ලියාපදිංචි වී ඇත/නැත)

[සංවිධානය අංක ............... දරන ශ්‍රී ලංකා සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස සංස්ථාපනය කර ඇත. යම් හෙයකින් සමාගම අවසන් කිරීමට සිදුවුවහොත් සාමාජිකයන්ගේ වගකීම එක් සාමාජිකයෙකුට රු. ............... ට සීමා වේ.]

සංවිධානය ශ්‍රී ලංකා භාර ආඥා පනත යටතේ පිහිටුවා ඇත*

සංවිධානයේ පාලක මණ්ඩලයේ / භාරකරුවන්ගේ නම් අංක ........... දරන පිටුවේ දී ඇත.

එය ශ්‍රී ලංකාවේ නිත්‍ය පදිංචිය ඇති අතර එක්සත් රාජධානියේ ඒබීසී හි දේශීය නියෝජිතයා වේ. සංවිධානයේ ක්‍රියාකාරකම්වල ප්‍රධාන ස්ථානය පිහිටා ඇත්තේ, ........................

මූල්‍ය ප්‍රකාශන වල "සංවිධානය" යනුවෙන් හැඳින්වෙනුයේ ඒබීසී ශ්‍රී ලංකාය.

ඒවායේ අදාළ ක්‍රියාකාරකම් සාක්ෂාත් කරගැනීමෙන් අදාළ කාර්යය ඉටු කිරීමේදී එකඟ වූ කොන්දේසි ප්‍රකාරව සමහර ක්‍රියාකාරකම් අවසන්වීම හැර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත්තේ අඛන්ඩ පැවැත්ම පදනම් කරගෙනය.

පිටු .......... සිට ........... දක්වා මූල්‍ය ප්‍රකාශනවලට වන සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.

වෙනත් අන්දමකින් සඳහන් කර නොමැති නම් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති සියලුම වටිනාකම් සඳහන් කර ඇත්තේ රුපියල් දහස් ගණන් වලිනි (රු. '000).

2. **පිළියෙළ කිරීමේ පදනම**

2.1 **අනුකූලවීමේ ප්‍රකාශනය**

2013 මාර්තු 31 දින සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග එක්ව ගිණුම් ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් (ශ්‍රීලනිපප්‍රය) නිකුත් කරන ලද ලාභ සඳහා නොවන සංවිධාන සඳහා (රාජ්‍ය නොවන සංවිධාන ඇතුලුව) ශ්‍රී ලංකා නිර්දේශිත පරිචය ප්‍රකාශනයට අනුකූල වේ.

2.2 **මැනීමේ පදනම**

ඒවායේ සාධාරණ අගයට සඳහන් කර ඇති මූල්‍ය සුරැකුම්පත් මූල්‍ය සාධන පත්‍ර ව්‍යුත්පන්නන හැර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුති භාවිත කරය.

2.3 **භාවිතමය සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල**

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් (රුපි) වලිනි. එය සංවිධානයේ භාවිතමය සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදලය. සියලුම මූල්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ රුපියල් වලින් වන අතර අන්වශයෙන් සඳහන් කර නොමැති නම් ආසන්නතම දහසට කෙටි කර ඇත.

2.4 **ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම් සහ හෙළිදරව් කිරීම්**

*අදාළ පරිදි තෝරාගත යුතුය.

අන්වශයෙන් සඳහන් කර නොමැත්තේ නම් හැර ගිණුම් ප්‍රතිපත්තින් සංගතව ව්‍යවහාර කර ඇති අතර, 2012 නිකුත් කළ ශ්‍රීලංනිපප්‍රය මගින් නිශ්චය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති වල වෙනස්වීම් හැර පෙර වර්ෂවල භාවිත කළ ගිණුම් ප්‍රතිපත්ති සමග සංගතව භාවිත කර ඇත.

**2.5 සැලකිය යුතු අන්දමේ ගිණුම්කරණ විනිශ්චය කිරීම්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්**

වාර්තා කරන දින අසම්භාව්‍ය වත්කම් සහ වගකීම් හෙළිදරව් කිරීම, වාර්තා කළ ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් වල වටිනාකම්වලට බලපෑම් වියහැකි විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන පිළිබඳ කළමනාකාරිත්වයේ විනිශ්චය ගැනීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිලිබඳව අනියතාවේ ප්‍රතිඵලයක් ලෙස වන ප්‍රතිවිපාකයන් වශයෙන්, වත්කම් හෝ වගකීම් වල ධාරණ අගයට අනාගතයේදී වන බලපෑමට ප්‍රමාණාත්මක ගැලපීම් කිරීම අවශ්‍ය වේ.

**විනිශ්චයන්**

ඒබීසී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති ව්‍යවහාර කරන ක්‍රියාවලියේදී, මූල්‍ය ප්‍රකාශනවල වඩාත් බලපෑමක් වන හඳුනාගත් වටිනාකම් මත ඇස්තමේන්තුකරණයට ඉවහල් වන දෑ හැර, කළමනාකාරිත්වය පහත සඳහන් විනිශ්චයන් කර ඇත. (කළමනාකාරිත්වය විසින් කරනලද විනිශ්චයන් සඳහන් කරන්න.)

**ඇස්තමේන්තු සහ උපකල්පනයන්**

අනාගතය පිළිබඳ සැලකිලිමත්වන ප්‍රධාන උපකල්පන සහ මීළඟ මුදල් වර්ෂය තුලදී වත්කම් සහ වගකීම් වල ධාරණ අගයට ප්‍රමාණාත්මක ගැලපීමක් සිදුවිය හැකි, වාර්තා කරන දින සැලකිය යුතු අන්දමේ අවදානමක් වීමේ අනියතාවය ඇස්තමේන්තු කිරීමේ වෙනත් තීරණාත්මක ප්‍රභවයන් පහත සාකච්ඡා කෙරේ.

**3. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශයන්**

**3.1 විදේශ - ව්‍යවහාර මුදල් ගනුදෙනු**

ශ්‍රී ලංකා රුපියල් වලින් හැර අනෙක් ව්‍යවහාර මුදල් වලින් වූ ගනුදෙනු, ශ්‍රී ලංකා රුපියල් වලට ගනුදෙනු වූ දින බොහෝදුරට සත්‍ය අනුපාතිකයට ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කර ඇත. වාර්තා කරන දින විදේශ ව්‍යවහාර මුදලින් නම් කරනලද මූල්‍ය වත්කම් (සුරැකුම් පත් ඇතුළුව) සහ වගකීම් එම දින වූ විනිමය අනුපාතිකයට ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කර ඇත. ඓතිහාසික පිරිවැයට සඳහන් විදේශ ව්‍යවහාර මුදලින් වන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් ගනුදෙනු වූ දින විනිමය අනුපාතිකයට පරිවර්තනය කර ඇත. උපලබ්ධි වූ සහ උපලබ්ධි නොවූ විනිමය වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වාර්තා කර ඇත.

ප්‍රධාන විනිමය අනුපාතිකයන් පහත දැක්වේ.

| *ව්‍යවහාර මුදල* | *අවසාන අනුපාතිකය* | | *සාමාන්‍ය අනුපාතිකය* | |
|---|---|---|---|---|
| | 2013.03.31 | 2012.03.31 | 2013.03.31 | 2012.03.31 |
| | | | | |

**3.2 මුදල් හා මුදල් වලට සමාන දෑ**

අත ඇති මුදල්, බැංකුවලින් ලැබිය යුතු මුදල්, මුල් පරිනත කාලය මාස තුනක් හෝ ඊට අඩු කාලයක් සඳහා වූ කෙටිකාලීන තැන්පත්, "මුදල් හා සමාන දේවල්" ලෙස ඒබීසී ශ්‍රී ලංකා සලකයි. ඉල්ලූවිට ගෙවියයුතු බැංකුවෙන් ණයට ගැනීම් ඒබීසී ශ්‍රී ලංකා හි මුදල් කළමනාකරණයේ සංකලිත කොටසක් සෑදෙන අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණ සඳහා මුදල් හා මුදල්වලට සමාන දෑහි සංරචකයක් ලෙස ඇතුළත් කර ඇත.

**3.3 මූල්‍ය සාධන පත්‍ර**

ඒබීසී ශ්‍රී ලංකා මූල්‍ය වත්කම් පහත සඳහන් ප්‍රභේදයනට වර්ගීකරණය කරයි. ලාභ හා අලාභ හරහා සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්, පරිණත වනතෙක් රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබියයුතු දෑවල් සහ විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්.

*ලාභ හා අලාභ හරහා සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්*

කිසියම් සම්ප්‍රයුක්ත ප්‍රතිලාභ හෝ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය ලෙස හඳුනාගෙන ලාභ හා අලාභ හරහා සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ඒබීසී ශ්‍රී ලංකාහි සුරැකුම්පත් කළඹක් පදනම මත බාහිරව කළමනාකරණය කරන හෙයින් සුරැකුම් පත්වලින් වන සියලු ආදායම් හෙළිදරව් කර ඇත්තේ ශුද්ධ වටිනාකමටය. ඒබීසී ශ්‍රී ලංකා වෙනුවෙන් කළඹේ කළමනාකරු, ආයෝජන විකිණීමට හෝ මිලදී ගැනීමට බැඳෙන වෙළඳ දින සුරැකුම්පත් හඳුනාගැනීම හෝ ඉවත්කිරීම සිදුවේ.

ලැයිස්තුගත සුරැකුම්පත්වල සාධාරණ අගය වන්නේ වාර්තා කරන දින ඒවායේ මිල සඳහන් කළ ලංසු මිලයි. මූල්‍ය ආදායම ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ පොලී මුදලින් සහ සාධාරණ අගය වෙනස් වීම නිසා වන ශුද්ධ උපලබ්ධි වූ හෝ උපලබ්ධි නොවූ ප්‍රතිලාභ වලිනි. වත්කමේ සඵල ඵලදාව ගණන් ගනිමින් පොලී ආදායම උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

*පරිණත වන තෙක් රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්*

සංවිධානයට ණය සුරැකුම්පත් පරිණත වන තෙක් රඳවාගැනීමට සාධනීය අභිප්‍රායක් හෝ හැකියාවක් ඇත්නම්, එවිට එවැනි මූල්‍ය වත්කම් පරිණත වනතෙක් රඳවාගෙන ඇති ලෙස වර්ගීකරණය කෙරේ. ඒවා මූලිකව හඳුනා ගන්නේ සාධාරණ අගයට යම් සෘජුව ආරෝපණය කළහැකි යම් ගනුදෙනු කිරීමේ පිරිවැයක් එකතු කිරීමෙනි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව ඒවා මනිනුයේ, සඵල පොලී අනුපාතිකය භාවිත කර ක්‍රමක්ෂය පිරිවැයෙන් යම් හානිකරණ අලාභයන් අඩු කිරීමෙනි.

*ණය සහ ලැබියයුතු දෑ*

ඒබීසී ශ්‍රී ලංකා ණය සහ ලැබියයුතු දෑ ඒවා ආරම්භ කල දිනට මූලික වශයෙන් හඳුනා ගනී. සියලුම වෙනත් මූල්‍ය වත්කම් මූලිකව ඒවායේ වෙළඳ දිනට හඳුනා ගනී. එනම් සංවිධානය සාධන පත්‍රයේ ගිවිසුම්ගත විධිවිධාන වලට පාර්ශ්වයන් වන්නේ එදින වීම නිසාය. නොගෙවීම නිසාවන අවදානම ආවරණය කරගැනීමට ණය සහ ලැබියයුතු දෑ වල හිඟහිටි වටිනාකමින් ඉඩහැරීමක් අඩු කිරීමෙන් පසු ඒවායේ පිරිවැයට සඳහන් කරනු ලැබේ.

*විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්*

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් ලෙස නම්කර ඇති සහ ඉහත සඳහන් ප්‍රභේදයන්හි වර්ගීකරණය කර නොමැති ඕනෑම මූල්‍ය වත්කමය. ඒවා මූලිකව හඳුනාගන්නේ සාධාරණ අගයට යම් සෘජුව ආරෝපනය කළ හැකි යම් ගනුදෙනු කිරීමේ පිරිවැයක් එකතු කිරීමෙනි. විකිණීම සඳහා ඇති ණය සාධන පත්‍ර මත වන හානිකරණ අලාභයන් සහ විදේශ ව්‍යවහාර මුදල් වෙනස්කම්වල, විස්තීර්ණ ආදායමේ හඳුනාගෙන සහ ස්කන්ධයේ ඉදිරිපත් කිරීම හැර මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, ඒවා මනිනුයේ ඒවායේ සාධාරණ අගය අනුවය. ආයෝජනයක් ඉවත් කළවිට, ස්කන්ධයේ සමුච්චිත වූ ප්‍රතිලාභය හෝ අලාභය, ලාභ හෝ අලාභ වලට යලි වර්ගීකරණය කරනු ලැබේ.

*මූල්‍ය වත්කම් හානිකරණය*

යම් හානිකරණයක ඇඟවීමක් ඇත්දැයි නිර්ණය කිරීමට ඒබීසී ශ්‍රී ලංකා හි වත්කම්වල ධාරණ අගයන් සෑම වාර්තාකරන දිනයකම සමාලෝචනය කෙරේ. මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී ඇත්දැයි දැනගැනීමට යම් විෂයානුබද්ධ සාක්ෂි තිබේද යන්න පිළිබඳව සංවිධානය තක්සේරුවක් කෙරේ.

වත්කම හෝ වත්කම් මුල් හඳුනාගැනීමෙන් පසු (සිදුවූ "පාඩු සිද්ධියක්") එකක් හෝ ඊට වැඩි ගණනක සිද්ධිවල ප්‍රතිඵලයක් ලෙස හානිකරණයවී ඇති යම් විෂයබද්ධ සාක්ෂි තිබේනම් සහ විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළහැකි මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයක අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහය එම පාඩු සිද්ධිය බලපෑමක් වන්නේ නම් පමණක් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී ඇතැයි සැලකිය හැකිය. හානිකරණය සඳහා වන සාක්ෂිවලට ඇතුළත් ඇඟවීම් වියහැක්කේ, ණයගැතියන් හෝ ණයගැතියන්ගේ කණ්ඩායමක සැලකිය යුතු අන්දමේ මූල්‍ය දුෂ්කරතා වලට මුහුණපාමින් සිටින බව පොලී හෝ මූලික ගෙවීම පැහැර හැරීම, ඔවුන් බුන්වත්බවට පත්වීමට හැකි බවට වන සම්භාව්‍යතාවය හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයන් සහ පැහැර හැරීම්වලට සහ සම්බන්ධ වන හිඟහිටි මුදල් වල හෝ ආර්ථික තත්ත්වවල වෙනසක් වැනි නිරීක්ෂණය කළහැකි දත්ත මගින් අනාගත මුදල් ප්‍රවාහවල මැනිය හැකි අන්දමේ අඩුවීමක් ඇඟවීම. යම් ඇඟවීමක් පවතී නම්, වත්කමේ අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කෙරේ.

ඕනෑම වේලාවක වත්කමක ධාරණ අගය එහි අයකරගත හැකි වටිනාකමට වැඩිවන විට, හානිකරන අලාභයන් හඳුනාගනු ලැබේ. හානිකරණ අලාභයන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. අයකරගත හැකි වටිනාකම නිර්ණය කිරීමට භාවිත කළ ඇස්තමේන්තුවල වෙනසක් සිදුවී ඇත්නම් හානිකරණ අලාභයන් පරිවර්ත්‍ය කරනු ලැබේ. එහෙත් එය එසේ කරනුයේ හානිකරණ අලාභයන් හඳුනාගෙන නොමැති නම්, ක්ෂය හෝ ක්‍රමක්ෂය අඩු කිරීමෙන්, නිර්ණය කළ යුතු වූ ධාරණ අගයට වඩා වත්කමේ ධාරණ අගය නොඉක්මවන ප්‍රමාණයට පමණි.

3.4 **තොග**

පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට තොග අගය කරනු ඇත. විකිණීම කිරීමට අවශ්‍යකරණ ඇස්තමේන්තුගත පිරිවැය අඩු කිරීමෙන් පසු වෙළඳපොළේ සාධාරණ ලෙස තොග අලෙවි කරගැනීමට අපේක්ෂා කරන මිල, ශුද්ධ උපලබ්ධි අගයයි.

වර්තමාන ස්ථානය සහ තත්ත්වය දක්වා තොග පත්කිරීමට දරන පිරිවැයට, ප්‍රථම ලැබූ ප්‍රථම පිටවූ පදනම මත අමුද්‍රව්‍ය පිරිවැය, යම් සෘජු ශ්‍රමය සහ සෘජු පොදුකාර්යවල උචිත කොටසක් ඇතුළත් වේ.

බෙදාහැරීම හෝ යළි විකිණීම සඳහා පරිත්‍යාග කරන ලද අයිතම, ඒවා බෙදාහරින හෝ යලි විකුණූ අවස්ථා වනතෙක්, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු නොලැබේ.

3.5 **දේපළ පිරියත සහ උපකරණ**

අ. පිරිවැය සහ අගය කිරීම

දේපළ, පිරියත සහ උපකරණ වල සියලුම අයිතමයන් මුල් පිරිවැයට වාර්තා කෙරේ. පසුව දේපළ, පිරියත සහ උපකරණවල යම් අයිතමයක් ප්‍රත්‍යාගණනය කළහොත්, එම වත්කමේ සම්පූර්ණ පන්තියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. ප්‍රත්‍යාගණනය ප්‍රමාණවත් ක්‍රමානුකූල අන්දමකට කරනුයේ, මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දින ඒවායේ ධාරණ වටිනාකම, ඒවායේ සාධාරණ අගයන්ගෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් නොවීම තහවුරු කිරීමටය. වත්කමක් මුල් හඳුනාගැනීමෙන් අනතුරුව, දේපළ පිරියත සහ උපකරණ ඓතිහාසික පිරිවැයට පවත්වාගෙන යෑම හෝ යළි ප්‍රත්‍යාගණනය කළේ නම් ප්‍රත්‍යාගණන වටිනාකමෙන් පසුව වූ යම් ක්ෂය කිරීමක් අඩුකර පවත්වාගෙන යනු ලැබේ. අවසන් ප්‍රත්‍යාගණනයට පසුව එකතු කිරීම්, පිරිවැයෙන් පසුව කරන ලද යම් ක්ෂය කිරීම් අඩුකර පවත්වාගෙන යා යුතුය.

අයිතිය හිමි ගොඩනැගිලි ඒබීසී ශ්‍රී ලංකාහි අරමුණු සඳහා භාවිත කරන අතර, ඒවා ආයෝජන දේපළ නිර්වචනය තුළට නොවැටේ.

ආ. පසුව කරනලද වියදම්

දේපළ සහ උපකරණ අයිතමයක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩිවෙන වනවිට පමණක් පසුව කරන ලද වියදම් ප්‍රාග්ධනගත කෙරේ. වෙනත් සියලු වියදම් දරන ලද වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

ඇ. ක්ෂය කිරීම

ඉඩම් හැර සියලු දේපළ පිරියත සහ උපකරණ සඳහා පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම මත සරල මාර්ගික පදනම මත ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ. එසේ කරනුයේ එවැනි වත්කම්වල ඇස්තමේන්තුගත කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා එවැනි වටිනාකම් වලින් යම් සමාප්තික අගයක් වේනම් එය අඩුකර ලියාහැරීම නිසි ලෙස කිරීමටය.

ඒබීසී ශ්‍රී ලංකා දැනට භාවිත කරනු ලබන වාර්ෂික ක්ෂය කිරීම් අනුපාතික වනුයේ,

| වත්කම් | වාර්ෂික අනුපාතිකය |
|---|---|
| ගොඩනැගිලි | 2 1/2% |
| මෝටර් වාහන | 20% |
| පරිගණක උපකරණ | 33 1/3% |
| පරිගණක මෘදුකාංග | 33 1/3% |
| කාර්යාලීය උපකරණ | 20% |
| ලීබඩු සහ සවිකිරීම් | 10% |

(මෙම අනුපාතික නිදර්ශනාත්මක ප්‍රකාශනයක අරමුණ සඳහා පමණක් වන අතර, නිර්දේශ කරනු ලබන අනුපාතික නොවේ.)

ඈ. පරිත්‍යාග කරන ලද වත්කම්

සීමා කරන ලද අරමුදල් හරහා ව්‍යාපෘතියක කොටසක් වශයෙන් මිලදී ගත් දේපළ පිරියත සහ උපකරණ ව්‍යාපෘතිය නිමවන තුරු හෝ ව්‍යාපෘතිය නිමවීමේදී, වත්කම ප්‍රතිලාභීන්ට භාරදෙනු නොලැබුවේ නම්, හෝ මුල් ප්‍රදානය කරන්නා වෙත ආපසු භාරදෙනු නොලැබුවේ නම්, වත්කමේ පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ සිහිවටන තොගයක ඇතුළත් කර එලෙස මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත යුතුය. එවැනි වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය කරනු නොලැබේ.

***විකල්ප පිළියම***

සීමා කරන ලද අරමුදල් හරහා ව්‍යාපෘතියක කොටසක් වශයෙන් මිලදී ගත් දේපළ පිරියත සහ උපකරණ ව්‍යාපෘතිය නිමවීමේදී වත්කම ප්‍රතිලාභීන්ට භාරදෙනු නොලැබුවේ නම්, හෝ මුල් ප්‍රදානය කරන්නා වෙත ආපසු භාරදෙනු නොලැබුවේ නම්, ව්‍යාපෘතිය නිමවීමේදී වත්කම අගය කර සහ ප්‍රාග්ධන සංචිතයක් හරහා දේපළ පිරියත සහ උපකරණ යටතේ වත්කම මූල්‍ය ප්‍රකාශන තුළට ගෙන එනු ලැබේ. අගය කිරීමේ පදනම මෙහි පහත දැක්වෙන පරිදි වේ. එවැනි වත්කම් සඳහා ප්‍රතිපාදනය කෙරෙන ක්ෂය කිරීම් සංචිතයට එරෙහිව අය කෙරේ. ක්ෂය කිරීමේ අරමුණ සඳහා මිලදීගත් දිනය ලෙස සැලකෙන්නේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීම සඳහා අගය කළ දිනය ය.

3.6 **අස්පෘශ්‍ය වත්කම්**

වෙන්ව අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් මුල් හඳුනාගැනීමේදී මනිනුයේ පිරිවැයටය. අසීමිත ප්‍රයෝජනවත් ජීවිත කාලයක් ඇති වත්කම් හැර අනෙකුත් වත්කම් සඳහා මුල් හඳුනාගැනීමෙන් අනතුරුව, අස්පෘශ්‍ය වත්කම් පවත්වාගෙන යනු ලබන්නේ යම් සමුච්චිත ක්‍රම ක්ෂය කිරීමක් හෝ යම් හානි කරන අලාභයක් අඩුකළ පිරිවැයටය. බණී 38 - අස්පෘශ්‍ය වත්කම් යටතේ හඳුනාගැනීමේ නිර්ණායකය විශ්වාසදායක ලෙස මැනියනොහැකි නිසා, අභ්‍යන්තරව ජනනය වූ අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනගත කරනු නොලැබේ. එබැවින් දරනලද වියදම, වියදම දරන ලද වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිළිබිඹු වේ.

අස්පෘශ්‍ය වත්කම්වල ජීවිතකාලය එක්කෝ සීමිත හෝ අසීමිත ලෙස තක්සේරු කෙරේ.

සීමිත ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරන අතර ඕනෑම වේලාවක අස්පෘශ්‍ය වත්කම හානිකරණය වී ඇතැයි ඇඟවීමක් කෙරෙන විටෙකදී, අස්පෘශ්‍ය වත්කම් හානිකරණය සඳහා තක්සේරු කරනු ඇත. සීමිත ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක ක්‍රමක්ෂය ක්‍රමය සහ කාලපරිච්ඡේදය අඩුම වශයෙන් සෑම වර්ෂයක් අවසානයේදී සමාලෝචනය කෙරේ.

වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂිත ජීවිත කාලය, හෝ අපේක්ෂිත පාරිභෝජන රටාවේ වෙනස්වීම්, ක්‍රමක්ෂය ක්‍රමය හෝ කාලසීමාව වෙනස් කිරීමෙන් උචිත පරිදි ගිණුම් ගතකරන අතර, ඒවා ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙස සලකනු ලැබේ.

සීමිත ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ක්ෂය කිරීමේ වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

අසීමිත ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ. එවැනි අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කරනු නොලැබේ. අසීමිත ජීවිතකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය, අසීමිත ජීවිත කාල තක්සේරුව අඛන්ඩව පවතින බවට සහාය වියහැකිද යන්න නිර්ණය කිරීමට වාර්ෂිකව සමාලෝචනය

කෙරේ. එසේ නොවන්නේ නම් ප්‍රයෝජනවත් ජීවිත කාලය තක්සේරුව අසීමිත සිට සීමිත දක්වා අනාගතයට බලපාන පදනමක් මත වෙනස් කළ යුතුය.

3.7 **මූල්‍ය වගකීම්**

මුල් හඳුනාගැනීමෙන් පසු පොලී දරන ණය පිරිවැය සහ ණය නිදහස් කිරීමේ වටිනාකම අතර යම් වෙනසක් වේ නම් එය සඵල පොලී පදනම මත ණය මුදලේ කාල සීමාව පුරා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගැනීම සමග ක්‍රමක්ෂය පිරිවැයට සඳහන් කරනු ලැබේ.

පොලී රහිත ණය මුල් හඳුනාගැනීමේදී වාර්තාකරනුයේ සාධාරණ අගයට වන අතර, එය වෙළඳපොළ සම්බන්ධිත වට්ටම් අනුපාතිකයක් භාවිත කර ලබාගන්නා අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගයයි. මෙම ණයවල මුල් හඳුනාගැනීමේදී වන පිරිවැය සහ සාධාරණ අගය අතර වෙනස විලම්භිත ආදායමයි. මෙම ණය සහ විලම්භිත ආදායම පසුව ක්‍රමක්ෂය කළ පිරිවැයට හඳුනාගන්නා අතර සම්බන්ධිත වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ බෙදාහරිනු ලැබේ.

3.8 **ප්‍රතිපාදන**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රතිපාදනයන් හඳුනාගනු ලබනුයේ, පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් බැඳියාව නිරවුල් කිරීමට වත්කම්වල ගලායාම අවශ්‍ය වීම භව්‍ය වියහැකි සහ බැඳියාව විශ්වාසදායක ලෙස මැනිය හැකි නෛතික හෝ සම්මුතික බැඳියාවක් ඒබීසී ශ්‍රී ලංකා වෙත ඇතිවිටෙකය. ප්‍රතිපාදන ලෙස වාර්තා කර ඇති සමහර මෙහෙයුම් හිමිකම්පෑම් සඳහා ඒවායේ අනුරූප ස්වභාවය සහ අනියතාවයන් පිළිබඳව විස්තරාත්මක තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රායෝගික නොවේ. බලපෑම ප්‍රමාණාත්මක නම්, ප්‍රතිපාදන තීරණය කරන්නේ, මුදලේ කාල වටිනාකමේ ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරුව පිළිබිඹු වීමට සහ උචිත වන පරිදි වගකීමට නිශ්චිත අවදානම් සඳහා අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමෙනි.

3.9 **සේවක ප්‍රතිලාභ**

අ. නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂිකය

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් යනු විශ්‍රාම සැලැස්මක් වන අතර, එය නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් නොවේ. විශ්‍රාම ගැනීමේදී සේවකයාට ලැබියයුතු විශ්‍රාම ප්‍රතිලාභ වල ප්‍රමාණය නිර්වචිත ප්‍රතිලාභ සැලසුම නිර්වචනය කරන අතර, මෙය සාමාන්‍යයෙන් රඳා පවත්නේ සේවකයාගේ වයස, සේවය කරන ලද අවුරුදු ගණන සහ වන්දි මුදල (හානි පූරණය) යන සාධක වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් මතය.

නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති වගකීම වනුයේ, හඳුනා නොගත් අතීත සේවා පිරිවැය සඳහා ගැලපුම් සමග මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දින නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වර්තමාන අගයයි. ස්වාධීන ආයු ගණකයෙක් විසින් වාර්ෂිකව ප්‍රක්ෂේපණය කළ ඒකක බැර ක්‍රමය භාවිත කර නිර්වචිත ප්‍රතිලාභ බැඳියාව ගණනය කරයි. නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවේ වර්තමාන අගය නිර්ණය කරනුයේ දිගුකාලීන රජයේ බැඳුම් කර හෝ උසස් තත්ත්වයේ සංස්ථාපිත බැඳුම්කරවල පොලී අනුපාතික භාවිත කර ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ වල ගලායැම් වට්ටම් කිරීමෙනි.

නිශ්චය කරනලද කාල පරිච්ඡේදයක් (පවරා ගැනීමේ කාල පරිච්ඡේදය) සේවකයෙක් සේවයේ රැඳී සිටීමේ කොන්දේසිය මත, නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම මත වෙනස්වීම රඳා පවත්නේ නම් හැර, අතීත සේවා පිරිවැය වහාම ආදායමේ හඳුනා ගනු ලැබේ. මෙම අවස්ථාවේදී අතීත සේවා පිරිවැය පවරාගැනීමේ කාලය පුරා සරල මාර්ගික පදනම මත ක්‍රම ක්ෂය කරනු ලැබේ.

ඒබීසී ශ්‍රී ලංකා ආයු ගණක ප්‍රතිලාභ සහ අලාභ හඳුනා ගැනීම සඳහා ප්‍රතිපත්තියක් වශයෙන් ගෙමග ක්‍රමය තෝරා ගනී. ඒ අනුව පහත දැක්වෙන අයුරුවලට වඩා විශාල ප්‍රමාණයක් ඉක්මවන ශුද්ධ සමුච්චිත ආයු ගණක ප්‍රතිලාභ හෝ අලාභයන් හි නිශ්චය කරන ලද කොටසක් ඒබීසී ශ්‍රී ලංකා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී ;

(i) නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවේ (සැලැස්මේ වත්කම් අඩුකිරීමට පෙර) වර්තමාන අගයෙන් 10% ; සහ

(ii) ඕනෑම සැලසුම් වත්කම්වලින් 10% ක සාධාරණ වටිනාකම

ආ. නිර්වචිතදායක සැලසුම්

අදාළ ව්‍යවස්ථාවන් සහ රෙගුලාසි අනුව සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට දායක වීමට සුදුසුකම් ලබයි. ඒබීසී ශ්‍රී ලංකා සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% සහ 3% පිළිවෙළින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට දායකවීම කරයි.

3.10 **අරමුදල් / සංචිත ලැබීම් සහ භාවිතයේ යෙදවීම පිළිබඳ ගිණුම්කරණය**

**සංචිත**

සංචිත එක්කෝ සීමාකරන ලද හෝ සීමා නොකරන ලද ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

අ. සීමා නොකරන ලද සංචිත / අරමුදල්

සීමා නොකරන ලද අරමුදල් යනු ඒබීසී ශ්‍රී ලංකා හි පොදු අරමුණු වැඩි දියුණු කිරීටම සහ යම් නිශ්චිත අරමුණක් සඳහා නම්කර නොමැති ඒබීසී ශ්‍රී ලංකා හි අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අභිමතය පරිදි ප්‍රයෝජනය සඳහා ලබාගත හැකි අරමුදල්ය.
අදාළ ප්‍රදාන ගිවිසුමේ නියමයන් හෝ ප්‍රදානය කරන්නාගෙන් පසුව ලබාගත් අනුමැතිය සමග සීමා කරන අරමුදල් වල සිට සීමා නොකරන අරමුදල් වෙතට, අතිරික්ත අරමුදල් මාරු කරනු ලැබේ.

පොදු මහජනයාගෙන් ලැබූ දායකවීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ මුදල් පදනම මත හඳුනා ගනු ලැබේ.

ආ. නම් කරන ලද සංචිත / අරමුදල්

නිශ්චිත අරමුණක් සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය නම් කරනු ලබන සීමා නොකරන ලද අරමුදල් නම් කරනලද අරමුදල් ලෙස හඳුනා ගනු ලැබේ. මෙම අරමුදල් ප්‍රයෝජනයට ගතහැකි ක්‍රියාකාරකම් මොනවාදැයි මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගැනේ.

ඇ. සීමාකරන ලද සංචිත / අරමුදල්

හඳුනාගත් ව්‍යාපෘතියකට හෝ ක්‍රියාකාරකමකට ප්‍රදානයන් ලැබුන විටදී, එවැනි අරමුදල් සීමාකරන ලද අරමුදලක රඳවාගෙන, ඒවා එම හඳුනාගත් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දරන ලද වියදම් සමග ගැලපීම සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ.

භාවිතයට නොගත් අරමුදල් ඒවායේ අදාළ අරමුදල් ගිණුම්වල රඳවා තබා ගන්නා අතර, ඒවා අවශ්‍ය කරන කාලය වන තෙක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල යටතේ ඇතුළත් කරනු ලැබේ.

යම් නිශ්චිත හෝ පැහැදිලි කළ අරමුණක් සඳහා අරමුදල් රැස් කිරීමේ ක්‍රියාකාරකමකින් රැස් කරගත් අරමුදල්ද මෙම ප්‍රභේදය යටතේ ඇතුළත් කරනු ලැබේ.

ලැබුණ ආදායමට වඩා අනුමත ප්‍රදාන වියදම් ඉක්මවන විට එම ශේෂය ලැබෙන බව නිසැක වනවිට එවැනි වටිනාකම ණයගැතියන් හරහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගත යුතුය.

මෙම සීමාකරන ලද අරමුදල් භාවිත කළ හැකි සහ භාවිත කරන ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් ලෙස හඳුනා ගැනේ.

ඇ. නිත්‍ය ආදායම් සංචිත / අරමුදල්

නිත්‍ය ආදායම් ලෙස වත්කම් ලැබුන විට, ඒවා වැයකර අවසන් කර නොමැති විටෙකදී එවැනි වත්කම් වලින් උපයන ලද ආදායම පමණක් හඳුනාගෙන ආදායම් ලෙස ප්‍රයෝජනයට ගත හැකිය.

ඉ. අදාළ ගිවිසුමෙන් හෝ වාර්තාවක සටහන් මගින් අන්වශයෙන් සලසන්නේ නම් මිස, ඉහත සඳහන් කළ සෑම ප්‍රභේදයක් යටතේ ලබාගත හැකි අරමුදල් වලින් උපලබ්ධි වන ආයෝජන ආදායම් සහ වෙනත් ප්‍රතිලාභ උචිත අරමුදල් වලට වෙන් කළ යුතුය.

3.11 **ප්‍රදාන සහ සහනාධාර**

ප්‍රදාන සහ සහනාධාර මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගන්නේ ඒවායේ සාධාරණ අගයන්ටය. ප්‍රදානයන් හෝ සහනාධාරයක් වියදමකට සම්බන්ධ වනවිට ක්‍රමානුකූල පදනමක් මත ආදායම හානිපූර්ණය කිරීමට අපේක්ෂා කරන පිරිවැය සමග ගැලපීමට අවශ්‍ය කාලය පුරා, එය ආදායමක් ලෙස හඳුනාගැනේ.

වත්කම්වලට සම්බන්ධ ප්‍රදාන සහ සහනාධාර සාමාන්‍යයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විලම්භනය කරනු ලබන අතර, වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

වත්කමක් මිලදී ගැනීම ඇතුලුව, සම්පූර්ණ ව්‍යාපෘතියක් හෝ ක්‍රියාකාරකමක් අරමුදල් කරනය සඳහා ලැබුන ප්‍රදාන අවස්ථාවකදී, එම වත්කමේ පිරිවැය ව්‍යාපෘති පිරිවැය සමග විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අයකර ඇති කල්හි විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට වත්කමේ පිරිවැය අයකර ඇති අන්දමට එම කාල පරිච්ඡේදයේම ප්‍රදාන වටිනාකම ආදායම් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. ව්‍යාපෘතිය අවසානයේදී වත්කම ප්‍රතිලාභීන්ට භාර නොදුන් හෝ මුල් ප්‍රදානකරුට ආපසු භාරනොදුන් වත්කමක පිරිවැය, මූල්‍ය ප්‍රකාශනවල සිහිවටන දේපළ, පිරියත සහ උපකරණ තොග ලෙස හඳුනාගනු ලැබේ.

3.12 **කල්බදු**

අ. මූල්‍ය කල්බදු

කල්බදු අයිතම්වල හිමිකමට ආනුශංගික සැලකිය යුතු අන්දමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ ඒබීසී ශ්‍රී ලංකා වෙත සඵලදායී ලෙස පැවරෙන මූල්‍ය කල්බදු මතවන දේපළ පිරියත සහ උපකරණ ප්‍රාග්ධන ගතකර ඒවායේ අත්පිට මිලට සහ කල්බදු වත්කම්වලින් ඒබීසී ශ්‍රී ලංකා ප්‍රයෝජනය ලැබීමට අපේක්ෂා කරන කාල පරිච්ඡේදය පුරා ක්ෂය කර මූල්‍ය කල්බදු ලෙස හෙළිදරව් කරනු ලැබේ.

කල්බදු දීමනාකරුට ගෙවියයුතු අනුරූප මුල් මුදල වගකීමක් ලෙස පෙන්වනු ලැබේ. කල්බදු ගෙවීම් මූල්‍ය ගාස්තු සහ කල්බදු වගකීමේ අඩුවීමත් අතර බෙදා වෙන්කරන අතර ඒ අනුව වගකීමේ හිඟහිටි ශේෂය මත ස්ථායි පොලී අනුපාතිකයන් ළඟාකර ගත හැකිය. කල්බදු කාලපරිච්ඡේදය පුරා ගෙවියයුතු පොලිය අවිනිශ්චිත පොලී ගිණුමකට මාරු කරනු ලැබේ. සෑම මුදල් වර්ෂයකම වාරික බැදියාවේ ඇතුළත් පොලී මූලිකාංගය කල්බදු කාල පරිච්ඡේදය පුරා විස්තීර්ණ ආදායම් ගිණුමට අයකරනු ලැබේ.

ආ. මෙහෙයුම් කල්බදු

කල්බදු කාල සීමාව පුරා හිමිකමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැහෙනදුරට සඵලදායක ලෙස කල්බදු දීමනාකරු තබාගන්නා කල් බද්දක්, මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කෙරේ. මෙහෙයුම් කල්බදු යටතේ ගෙවූ බදුකුලී විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ කල් බද්දේ කාලසීමාව පුරා සරල මාර්ගික පදනම යටතේ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

3.13 **ආදායම හඳුනාගැනීම**

අ. දායකවීම් / ආදායම් ප්‍රභවයන්

සීමාකරන ලද අරමුදල් වලින් උපලබ්ධි වූ ආදායම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනෙනුයේ අරමුදල් ලබාගැනීම සඳහා වන සියලුම කොන්දේසි ඉටුකර ඇතිබවට නියතතාවයක් ඇතිවිට සහ හානිපූරණය කිරීම අපේක්ෂා කරන ලද අදාළ වියදම් දරා, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අයකර ඇති විටකදී පමණි. ප්‍රයෝජනයට නොගත් අරමුදල් එලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරියට ගෙන යනු ලැබේ.

භාණ්ඩ වශයෙන් ලැබුණ ත්‍යාග හෝ ප්‍රදානයන්ගේ වටිනාකම හඳුනාගන්නේ ඒවා ප්‍රතිලාභීන්ට බෙදාදුන් අවස්ථාවේදී හෝ ඒබීසී ශ්‍රී ලංකාහි අරමුණු සඳහා ලද මනාව භාවිත කිරීම පිණිස ඒවා ලැබුනේ යලි විකිණීම සඳහා නම්, ඒවා විකුණුම් කරන මොහොතේදීය. නොවිකුණු හෝ බෙදාහරිනු නොලැබූ අයිතම, තොග ලේඛණගත කරන අතර නමුත් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු නොලැබේ. වටිනාකම් ප්‍රමාණනයකළ හැකි සහ ඒබීසී ශ්‍රී ලංකා හට එම අරමුදල් භාවිත කිරීමට නීත්‍යානුකූල හිමිකමක් ඇතිවනවිට සියලු වෙනත් ආදායම් හඳුනා ගනු ලැබේ. මෙයට අරමුදල් රැස් කිරීමේ ක්‍රියාකාරකම් වලින් ලැබියයුතු ආදායම් සහ ප්‍රදානයන් ඇතුළත් විය හැකිය.

ආ. අයභාරය

උපයන ලද පොලී උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

ලැබුණු ලාභාංශ හඳුනාගන්නේ ලාභාංශ ලැබීමට වන හිමිකම තහවුරු වන අවස්ථාවේදීය.
ලබාදුන් සේවයන් මතඉපයූ අයභාරයන් හඳුනාගන්නේ සේවා ලබාදුන් ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළදීය.
දේපළ පිරියත උපකරණ සහ ආයෝජනයන් ඇතුලුව වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීම මත වන ශුද්ධ ප්‍රතිලාභ හෝ අලාභ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගන්නේ, බැහැර කිරීම් මත වන ලද මනාවෙන් බැහැර කරනලද අයිතමයේ ධාරණ අගය සහ යම් සම්බන්ධිත විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසුවය. යම් ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක් සම්බන්ධයෙන් නම්, ප්‍රත්‍යාගණන සංචිතයේ ඉතිරිවී ඇති යම් ශේෂයක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ.

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

3.14 වියදම් හඳුනාගැනීම

ඒබීසී ශ්‍රී ලංකා හි ව්‍යාපෘති සහ වෙනත් ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා දරන ලද වියදම් ඒවා දරන ලද කාලපරිච්ඡේදය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. ඒබීසී ශ්‍රී ලංකා පරිපාලනය කිරීම සහ එය පවත්වාගෙන යෑම සඳහා සහ දේපළ පිරියත සහ උපකරණ අපේක්ෂිත තත්ත්වයෙන් කාර්යයන් ඉටුකිරීමට වන පිළිසකර කිරීමේ සහ නඩත්තු කිරීමේදී දරන ලද වෙනත් වියදම්, උපචිත පදනම ගිණුම්කරණය මත ඒවා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට හර කරනු ලැබේ.

එහි විස්තීර්ණ මූල්‍ය ප්‍රකාශනයේ ඒබීසී ශ්‍රී ලංකා හි ක්‍රියාකාරකම් වල මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට " වියදමේ ශ්‍රිත" ක්‍රමය ඒබීසී ශ්‍රී ලංකා තෝරා ගෙන ඇත.

3.15 බදුකරණය

අ. ප්‍රවර්තන බදු

මූල්‍ය ප්‍රකාශන වල ×× සටහනට යොමුකළ නිදහස් කිරීම් වලට යටත්ව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිළිබිඹු වන ආදායම් සහ වියදම් මූලිකාංග පදනම සහ 96 අ වගන්තිය යටතේ සහ ඒබීසී ශ්‍රී ලංකා උපයන ලද ලාභ මත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ආදායම් බදු ප්‍රතිපාදනය කර ඇත.

ආ. විලම්භිත බදු

යම් වෙනසක් පූර්වාදෘශ්‍ය අනාගත කාලයකදී පරිවර්ත්‍ය නොවීම සඳහා ගැළපුම් කර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දින ආදායම් බදු කාර්යය සඳහා ලැයිස්තු ගත වත්කම් සහ වගකීම් වල වටිනාකම සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව දැක්වෙන වත්කම් සහ වගකීම්වල වටිනාකම අතර වෙනසට විලම්භිත බදු ප්‍රතිපාදනය කර ඇත.

එවැනි විලම්භිත බදුවල ධාරණ අගය සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනකදීම සමාලෝචනය කරනු ලබන අතර යම් නව වත්කමක් ඇතුළත් කිරීමේ හේතුව නිසා එය වැඩි කළයුතු වන අතර, විලම්භිත වත්කමේ කොටසක් හෝ සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමට ඉඩදීම සඳහා ප්‍රමාණවත් බදු අයකළහැකි ලාභයන් ලබාගත හැකි බව තවදුරටත් භව්‍ය නොවන ප්‍රමාණය දක්වා විලම්භිත බදුවල ධාරණ අගය අඩු කළ යුතුය.

ඇ. එකතු කළ අගය මත බදු

සමහර අයිතම ආනයනය මත එකතු කළ අගය මත බදු (හෝ එඅමබ) ගෙවිය යුතු අතර, එය සාමාන්‍යයෙන් එම අයිතමවල පිරිවැයේ අන්තර්ගත වේ. මෙයට ව්‍යතිරේකයක් වියහැක්කේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පත්‍රයේ සඳහන් අයිතමයක් එය ලැබෙන එබඳු කාලය තෙක් තිබෙන කල්හිය.

3.16 ණය ගැනුම් පිරිවැය

අත්පත් කරගැනීමකට, තැනීමකට හෝ සුදුසුකම් ලබන වත්කමක් නිෂ්පාදනය කිරීමට ඍජුව ආරෝපණය වන ණය ගැනුම් පිරිවැය එම වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධන ගත කෙරේ. වෙනත් ණය ගැනුම් පිරිවැය ඒවා දරන ලද කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස සලකනු ලැබේ.

3.17 මූල්‍ය ආදායම් සහ වියදම්

ශුද්ධ මූල්‍ය ආදායම (×× සටහන බලන්න) ණය ගැනුම් මත ගෙවියයුතු පොලී, අරමුදල් ආයෝජන මත ලැබිය යුතු මුදල්, සුරැකුම් පත් ආදායම්, සහ ඉදිරි රැකුම් සාධන පත්‍රවලින් වන ප්‍රතිලාභ හෝ අලාභයන් ගෙන් සමන්විත වේ. වත්කමේ සඵල ඵලදාවමත ගණන් ගෙන ඒවා උපචිත වූ විට පොලී ආදායම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

3.18 අසම්භාව්‍ය වගකීම්

ඒබීසී ශ්‍රී ලංකා තුළ සම්පූර්ණ පාලනයෙන් තොර, ඒවායේ පැවැත්ම තහවුරු කළ හැක්කේ අනියත අනාගත සිදුවීම් එකක් හෝ ඊට වැඩි ගණනක් සිදුවීම හෝ නොසිදුවීම මත පමණක් වන, පසුගිය සිදුවීම්වලින් පැන නගින, වියහැකි බැඳියාවන් අසම්භාව්‍ය වගකීමක් වේ. ප්‍රමාණවත් විශ්වාසදායක ලෙස මැනිය නොහැකි ආර්ථික ප්‍රතිලාභ ගලායාම භව්‍ය නොවන, පසුගිය සිද්ධීන්ගෙන් පැනනගින එය වර්තමාන බැඳියාවක්ද විය හැකිය. එවැනි අසම්භාව්‍ය වගකීම් ×× සටහන යටතේ සටහන් කර ඇත. අසම්භාව්‍ය වගකීම් ලෙස සටහන් කර ඇති සමහර මෙහෙයුම් හිමිකම්පෑම් සඳහා ඒවායේ අනුරූප ස්වභාවය සහ අනියතතාවයන් මත විස්තරාත්මක තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රායෝගික නොවේ.

4. මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

4.1 දේපළ පිරියත සහ උපකරණ
(අ)

| *අයිතමය* | *2012.04.01 දිනට ශේෂය* | *වර්ෂය තුළ එකතු කිරීම්* | *වර්ෂය තුළ බැහැර කිරීම්* | *2013.03.31 දිනට ශේෂය* |
|---|---|---|---|---|
| පිරිවැයට / අගය කිරීම | | | | |
| ඉඩම් | ×××× | ×××× | ×××× | ×××× |
| ගොඩනැගිලි | ×××× | ×××× | ×××× | ×××× |
| මෝටර් වාහන | ×××× | ×××× | ×××× | ×××× |
| පරිගණක උපකරණ | ×××× | ×××× | ×××× | ×××× |
| පරිගණක මෘදුකාංග | ×××× | ×××× | ×××× | ×××× |
| කාර්යාලීය උපකරණ | ×××× | ×××× | ×××× | ×××× |
| ලීබඩු සහ සවිකිරීම් | ×××× | ×××× | ×××× | ×××× |
| | ×××× | ×××× | ×××× | ×××× |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | ×××× | ×××× | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× | ×××× | ×××× |

| *අයිතමය* | *2012.04.01 දිනට ශේෂය* | *වර්ෂය සඳහා අය කිරීම්* | *වර්ෂය තුළ බැහැර කිරීම්* | *2013.03.31 දිනට ශේෂය* |
|---|---|---|---|---|
| පිරිවැයට / අගය කිරීම මත ක්ෂය කිරීම | | | | |
| ඉඩම් | ×××× | ×××× | ×××× | ×××× |
| ගොඩනැගිලි | ×××× | ×××× | ×××× | ×××× |
| මෝටර් වාහන | ×××× | ×××× | ×××× | ×××× |
| පරිගණක උපකරණ | ×××× | ×××× | ×××× | ×××× |
| පරිගණක මෘදුකාංග | ×××× | ×××× | ×××× | ×××× |
| කාර්යාලීය උපකරණ | ×××× | ×××× | ×××× | ×××× |
| ලීබඩු සහ සවිකිරීම් | ×××× | ×××× | ×××× | ×××× |
| | ×××× | ×××× | ×××× | ×××× |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | ×××× | ×××× | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× | ×××× | ×××× |
| වත්කම් වල ශුද්ධ පොත් අගය | | | | |
| පිරිවැය මත | ×××× | ×××× | ×××× | ×××× |
| අගය කිරීම මත | ×××× | ×××× | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× | ×××× | ×××× |

(ආ) වත්කම්වල ශුද්ධ පොත් අගයේ ඛණ්ඩ විශ්ලේෂණය

| මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා | සංවිධානය 2013 | 2012 |
|---|---|---|
| ඛණ්ඩ | | |
| නිවාස සඳහා ප්‍රතිපාදන | xxxx | xxxx |
| ධීවර | xxxx | xxxx |
| වෙනත් ව්‍යාපෘති | xxxx | xxxx |
| පරිපාලන | xxxx | xxxx |

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුළත් නොකර ඇති ව්‍යාපෘති වත්කම්

පිරිවැයට / අගය කිරීම

| *අයිතමය* | *2012.04.01 දින ශේෂය* | *වර්ෂය තුළ එකතු කිරීම්* | *වර්ෂය තුළ ප්‍රාග්ධනගත කළ* | *වර්ෂය තුළ මාරු කරන ලද* | *2013.03.31 දින ශේෂය* |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | xxxx | xxxx | xxxx | xxxx | xxxx |
| මෝටර් වාහන | xxxx | xxxx | xxxx | xxxx | xxxx |
| පරිගණක උපකරණ | xxxx | xxxx | xxxx | xxxx | xxxx |
| පරිගණක මෘදුකාංග | xxxx | xxxx | xxxx | xxxx | xxxx |
| කාර්යාලීය උපකරණ | xxxx | xxxx | xxxx | xxxx | xxxx |
| ලී බඩු සහ සවිකිරීම් | xxxx | xxxx | xxxx | xxxx | xxxx |
| එකතුව | xxxx | xxxx | xxxx | xxxx | xxxx |

4.2 අස්පෘශ්‍ය වත්කම්

| *අයිතමය* | *2012.04.01 ශේෂය* | *වර්ෂය තුළ එකතු කිරීම්* | *වර්ෂය තුළ බැහැර කිරීම්* | *2013.03.31 දින ශේෂය* |
|---|---|---|---|---|
| පිරිවැයට/අගය කිරීම | | | | |
| මෘදුකාංග | xxxx | xxxx | xxxx | xxxx |
| ලාංඡනය | xxxx | xxxx | xxxx | xxxx |
| එකතුව | xxxx | xxxx | xxxx | xxxx |

| *අයිතමය* | *2012.04.01 ශේෂය* | *වර්ෂය තුළ අය කිරීම* | *2013.03.31 දින ශේෂය* |
|---|---|---|---|
| ක්‍රමක්ෂය | | | |
| මෘදුකාංග | xxxx | xxxx | xxxx |
| ලාංඡනය | xxxx | xxxx | xxxx |
| එකතුව | xxxx | xxxx | xxxx |
| ශුද්ධ පොත් අගය | xxxx | xxxx | xxxx |

4.3 දිගුකාලීන ලැබිය යුතු දෑ

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| විලම්භිත ආදායම් | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× |

4.4 වෙනත් මූල්‍ය වත්කම්

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| ඉදිරි ව්‍යවහාර මුදල් ගිවිසුම් | ×××× | ×××× |
| සහතික තැන්පත් | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× |

4.5 තොග

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | ×××× | ×××× |
| පරිපාලන, හඳුනාගැනීම් සහ ආරක්ෂක | ×××× | ×××× |
| ප්‍රකාශන | ×××× | ×××× |
| කෙරීගෙන යන වැඩ | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× |

තොග ලියාහැර වියදමට අයකළ වටිනාකම රු. ×××

4.6 ලැබිය යුතු ගිණුම්

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| ඔඩපනයන් (ඇපයට තැබීම්) | ×××× | ×××× |
| ජාතික සමිති සහ සංවිධාන | ×××× | ×××× |
| පදනම් සහ අරමුදල් | ×××× | ×××× |
| | ×××× | ×××× |
| රඳවාගත් බදු | ×××× | ×××× |
| ලැබියයුතු වෙනත් ආදායම් | ×××× | ×××× |
| ලැබියයුතු ගිණුම් සඳහා ඉඩහැරීම් | (×××) | (×××) |
| එකතුව | ×××× | ×××× |

4.7 පෙර ගෙවීම්

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| පෙරගෙවූ වියදම් | ×××× | ×××× |
| සැපයුම්කරුවනට ගෙවූ අත්තිකාරම | ×××× | ×××× |
| සමාජ ආරක්ෂණ සහ රක්ෂණ දායකවීම් | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× |

4.8 වෙනත් මූල්‍ය වත්කම්

| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | සංවිධානය 2013 | 2012 |
|---|---|---|
| ලාභාලාභ හරහා සාධාරණ අගයට | | |
| මූල්‍ය වත්කම් | xxxx | xxxx |
| එකතුව | xxxx | xxxx |

4.9 මුදල් හා මුදල් සමාන දෑ

| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | සංවිධානය 2013 | 2012 |
|---|---|---|
| අතැති මුදල් | xxxx | xxxx |
| බැංකුවේ ඇති මුදල් | xxxx | xxxx |
| කෙටිකාලීන තැන්පත් | xxxx | xxxx |
| එකතුව | xxxx | xxxx |

බැංකුවල ඇති මුදල් දෛනික බැංකු අනුපාතිකය පදනම් කර වල අනුපාතිකයන් යටතේ පොලී උපයයි. ඒබීසී ශ්‍රී ලංකාහි ක්ෂණික මුදල් අවශ්‍යතාවය පදනම් කර කෙටිකාලීන තැන්පත් දින එකේ සිට මාස 3 දක්වා අතර කාලපරිච්ඡේද සඳහා කරනු ලබන අතර අදාළ කෙටිකාලීන තැන්පත් අනුපාතික අනුව පොලී උපයයි.

සියලු පූර්ව කොන්දේසි සපුරාලන ලද බැඳුණු ආදානය නොකළ රුපි. xxxx ................ (රු. xxx ........: 2012) ණය පහසුකම් 2013 මාර්තු 31 දින ඒබීසී ශ්‍රී ලංකා සතුව පැවතින.

මුදල් ප්‍රවාහ ප්‍රකාශන වල අරමුණු සඳහා මාර්තු 31 දින මුදල් සහ මුදල් හා සමාන දේවල් පහත දැවලින් සමන්විත විය.

| | 2013.03.31 | 2012.03.31 |
|---|---|---|
| මුදල් හා මුදල් සමානදෑ | xxxx | xxxx |
| බැංකු අයිරාවයන් | xxxx | xxxx |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් වලට සමාන දෑ වල එකතුව** | xxxx | xxxx |

4.10 සීමා නොකරන ලද සංචිත / අරමුදල්

| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | සංවිධානය 2013 | 2012 |
|---|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | xxxx | xxxx |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් සීමා නොකළ | | |
| අතිරික්තය/ඌණතාවය | (xxx) | (xxxx) |
| වර්ෂය අවසානයේ ශේෂය | xxxx | xxxx |

4.11 නම් කරන ලද අරමුදල්

| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | සංවිධානය 2013 | 2012 |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | xxxx | xxxx |
| වර්ෂය තුළදී ලැබූ අමතර අරමුදල් | xxxx | xxxx |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශයනට මාරුකිරීම් | (xxx) | (xxx) |
| වර්ෂය අවසානයේ ශේෂය | xxxx | xxxx |

| | | |
|---|---|---|
| නම් කර ඇත්තේ, පහත දෑ සඳහාය | | |
| කාර්යාලීය ඉඩකඩ යළි සකස් කිරීම/ පුළුල් කිරීම් | xxxx | xxxx |
| සේවක සුභ සාධනය | xxxx | xxxx |
| | xxxx | xxxx |

4.12 සීමා කරන ලද අරමුදල්

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | xxxx | xxxx |
| වර්ෂය තුළ ලැබූ අමතර අරමුදල් | xxxx | xxxx |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට මාරු කිරීම් | (xxx) | (xxx) |
| සීමා නොකරන ලද අරමුදල්වලට මාරු කිරීම් | (xxx) | (xxx) |
| වර්ෂය අවසානයේ ශේෂය | xxxx | xxxx |

සීමා කරන ලද අරමුදල් ව්‍යාපෘති අනුව වෙන් කිරීම සහ සංචලනය

| ප්‍රදානය කරන සංවිධානයේ නම | ව්‍යාපෘතිය | ඉදිරියට ගෙනආ ශේෂය | වර්ෂය තුළ ලැබුණ/ සීමාකරන ලද අතිරික්තය | ආදායමට සහ වියදමට මාරු කිරීම | සීමාකරන ලද අරමුදල මත පොලී ආදායම | ඉදිරියට ගෙනයන ශේෂය |
|---|---|---|---|---|---|---|
| ABC | | | | | | |
| GH1 | | | | | | |
| MNO | | | | | | |
| XYZ | | | | | | |
| එකතුව | | | | | | |

4.13 නිත්‍ය ආදායම් අරමුදල්

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| වර්ෂය ආරම්භයේ ශේෂය | xxxx | xxxx |
| වර්ෂය සඳහා අතිරික්තය/ඌණතාවය | (xxx) | (xxx) |
| වර්ෂය අවසානයේ ශේෂය | xxxx | xxxx |

වර්ෂය අවසානයේ නිත්‍ය ආදායම් අරමුදල් සමන්විත වන්නේ:

| | | |
|---|---|---|
| ................................ | xxxx | xxxx |

4.14 වෙනත් ප්‍රාග්ධන සංචිත

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| වර්ෂය ආරම්භයේ ශේෂය | xxxx | xxxx |
| වර්ෂය සඳහා අතිරික්තය/ඌනතාවය | (xxxx) | (xxxx) |
| වර්ෂය අවසානයේ ශේෂය | xxxx | xxxx |

4.15 ණය සහ ණයට ගැනුම්

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31න් අවසන් වන වර්ෂය සඳහා | 2013 | 2012 |
| සුරැකුම් නොලත් පොලී රහිත ණය | ×××× | ×××× |
| අඩුකළා ජංගම කොටස | (×××) | (×××) |
| එකතුව | ×××× | ×××× |

ගොඩනැගිලිවලට සම්බන්ධිත පොලී රහිත ණය දෙකක් ඇති අතර දෙකම ප්‍රදානය කර ඇත්තේ රාජ්‍ය ආයතනයකිනි. මුල් හඳුනාගැනීමේදී මෙම ණය දෙකම හඳුනාගෙන ඇත්තේ ඒවායේ සාධාරණ අගයටය. සාධාරණ අගය සහ පිරිවැය අතර වෙනස විලම්භීත ආදායමේ සඳහන් කර ඇත (×× සටහන බලන්න). 2013 මාර්තු 31 දින මෙම ජංගම නොවන ණයවල සාධාරන අගයේ වටිනාකම රුපි. ×××× විය. දායක වූ සේවය සඳහා රු. ××× (රු. ×××× : 2012) නාමික පොලියක්, වියදම් හා ආදායම් වශයෙන් සටහන් කර ඇත.

4.16 සේවක ප්‍රතිලාභ වගකීම

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| අප්‍රේල් 1 දින ශේෂය | ×××× | ×××× |
| ප්‍රවර්තන සේවා පිරිවැය | ×××× | ×××× |
| පසුගිය සේවා පිරිවැය | ×××× | ×××× |
| පොලී පිරිවැය | ×××× | ×××× |
| ආයු ගණන අලාභ/(ප්‍රතිලාභ) | ×××× | ×××× |
| වර්ෂය තුළ ගෙවූ ප්‍රතිලාභ | (×××) | (×××) |
| මාර්තු 31 දින ශේෂය | ×××× | ×××× |

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගෙනඇති වටිනාකම් පහත දැක්වෙන පරිදියඃ

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | ×××× | ×××× |
| පසුගිය සේවා පිරිවැය | ×××× | ×××× |
| පොලී පිරිවැය | ×××× | ×××× |
| මාර්තු 31 දින ශේෂය | ×××× | ×××× |

මෙම බැඳියාව බාහිරව අරමුදල් කරණය කර නොමැත.

4.17 විලම්භීත ආදායම්

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| ඔඩපනවලට සම්බන්ධිත විලම්භීත ආදායම් | ×××× | ×××× |
| රජයේ ණයවලට සම්බන්ධිත විලම්භීත ආදායම් | ×××× | ×××× |
| මාර්තු 31 දින ශේෂය | ×××× | ×××× |

4.18 ගෙවියයුතු ගිණුම්

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31න් අවසන් වූ වර්ෂය සඳහා | 2013 | 2012 |
| ප්‍රදානය කරන්නන්ට ආපසු ගෙවිය යුතු | ×××× | ×××× |
| සැපයුම්කරුවන්ට | ×××× | ×××× |
| විවිධ අයිතම | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× |

ඉහත මූල්‍ය වගකීම්වලට නියමයන් සහ කොන්දේසි

- රජයන්, ජාතික සමිති, සංවිධාන, පදනම් අරමුදල් සහ සැපයුම්කරුවන් සඳහා වන වගකීම් සඳහා පොලියක් නොමැති අතර, සාමාන්‍යයෙන් දින 30ක කාලසීමාවකදී නිරවුල් කරනු ලැබේ.
- විවිධ අයිතම සඳහා පොලියක් නොමැති අතර සාමාන්‍ය කාල සීමාව මාස 6 කි.

4.19 උපචිත වියදම්

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2013 | 2012 |
| ජාතික සමිති, සංවිධාන | | |
| පදනම් සහ අරමුදල් | ×××× | ×××× |
| උපචිත වියදම් | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× |

4.20 ප්‍රතිපාදන

| | | සංවිධානය | |
|---|---|---|---|
| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | | 2013 | 2012 |
| අප්‍රේල් 01 දින ශේෂය | | ×××× | ×××× |
| වර්ෂයේ කරන ලද වෙන්කිරීම් | ×××× | ×××× | |
| වර්ෂය තුළ භාවිත කල ප්‍රතිපාදන | | ×××× | ×××× |
| වර්ෂය තුළ මුදාහළ ප්‍රතිපාදන | (×××) | (×××) | |
| එකතුව | | ×××× | ×××× |

ප්‍රධාන වශයෙන් නෛතික ස්වභාවයේ වන සහ ඒබීසී ශ්‍රී ලංකා භව්‍ය වශයෙන් ගෙවියයුතු යයි කළමනාකාරිත්වය සලකන මෙහෙයුම් හිමිකම් පෑම් ශේෂය නියෝජනය කරයි. සියලුම ප්‍රතිපාදන වර්ෂයක් තුළ නිරවුල් කිරීම අපේක්ෂා කෙරේ.

4.21 බැංකු අයිරාවන්

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| 1වන බැංකුවෙන් | ×××× | ×××× |
| 2වන බැංකුවෙන් | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× |

4.22 සම්පත් ප්‍රභවයන්

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| සාරාංශය | | |
| සංවිධානයේ පරමාර්ථයන් වැඩිදියුණු කිරීමට | | |
| වූ ක්‍රියාකාරකම් | | |
| ප්‍රදාන - සීමාකරන ලද අරමුදල්කරණය | ×××× | ×××× |
| ප්‍රදාන - සීමා නොකරන ලද අරමුදල්කරණය | ×××× | ×××× |
| පවරාදීම් වලින් ආදායම් | ×××× | ×××× |
| මහජනතාවගෙන් වූ පරිත්‍යාග | ×××× | ×××× |
| සංස්ථාපිත අරමුදල් රැස් කිරීම් | ×××× | ×××× |
| භාණ්ඩ වශයෙන් ලැබූ ත්‍යාග | ×××× | ×××× |
| වෙළඳ හෝ වෙනත් ක්‍රියාකාරකම් වලින් වූ ලාභ ((අ) යොමුව) | ×××× | ×××× |
| වෙනත් අරමුදල් රැස් කිරීමේ ක්‍රියාකාරකම් | ×××× | ×××× |
| | ×××× | ×××× |

| | | |
|---|---|---|
| (ඇ) වෙළඳ ක්‍රියාකාරකම් වලින් වූ ලාභ | | |
| විකුණුම් ලද මනාව | ×××× | ×××× |
| අයිතමවල පිරිවැය/සාධාරණ අගය | ×××× | ×××× |
| ඉපයූ ලාභය | ×××× | ×××× |

4.23 සේවක මණ්ඩල සම්බන්ධිත පිරිවැය

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| වැටුප් හා වේතන | ×××× | ×××× |
| සමාජ රක්ෂණ සහ සමාජ ප්‍රතිලාභ | ×××× | ×××× |
| දායක වූ සේවාවන් | ×××× | ×××× |
| පශ්චාත් සේවා වරප්‍රසාද පිරිවැය | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× |

2012/2013 තුළ සාමාන්‍ය සේවක /තරාතිරම් ගණන ××× කි.

4.24 සෘජු ව්‍යාපෘති / ක්‍රියාකාරකම් පිරිවැය

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| පරිපාලන පිරිවැය | ×××× | ×××× |
| උපදේශන ගාස්තු | ×××× | ×××× |
| ගමන් වියදම් | ×××× | ×××× |
| වෙනත් | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× |

4.25 කුලී

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
| පරිශ්‍ර සහ උපකරණ | ×××× | ×××× |
| ප්‍රවාහන | ×××× | ×××× |
| වෙනත් | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× |

4.26 ශුද්ධ මූල්‍ය ආදායම

| | සංවිධානය | |
|---|---|---|
| මාර්තු 31න් අවසන් වූ වර්ෂය සඳහා | 2013 | 2012 |
| ලාභාංශ | ×××× | ×××× |
| පොලී | ×××× | ×××× |
| සුරැකුම්පත් වලින් ප්‍රතිලාභ/(අලාභ) | ×××× | ×××× |
| එකතුව | ×××× | ×××× |

4.27 ආදායම් බදු වියදම්

| | | |
|---|---|---|
| සාමාන්‍ය ක්‍රියාකාරකම් මත ප්‍රවර්තන බදු | ×××× | ×××× |
| ලැබුණ ප්‍රදානයන් මත ලාසනොස බදු | ×××× | ×××× |
| ආදයම් බදු වියදමේ එකතුව | ×××× | ×××× |

අදාළ බදු අනුපාතික සහ අදාළ බදු පාලන ක්‍රම

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත අනුව සියලු රාජ්‍ය නොවන සංවිධාන වර්ෂයක් තුලදී උපයන ලද ඕනෑම අතිරික්තයක් මත ××% බදු බැඳියාවකට යටත් වන අතර, සමහර නිශ්චය කරන ලද නිදහස් කිරීම් වලට යටත්ව වර්ෂයක් තුළදී ලැබෙන සියලු ප්‍රදානයන් සඳහා ××% යටතේ බදු අය කෙරේ.

ඒබීසී සංවිධානය පනතේ ×× අනුව ආදායම් පදනම මත බදුවලින් නිදහස් කර ඇති අතර පහත සඳහන් ක්‍රියාකාරකම් පනතේ ×× වගන්තිය යටතේ ප්‍රදාන සඳහා වන බදු වලින් නිදහස් කර ඇත.

4.28 ව්‍යාපෘති ක්‍රියාකාරකම් සාරාංශය

| හඳුනාගත් ව්‍යාපෘති | සීමාකරන ලද අරමුදල් වලින් මාරු කිරීම් | | සීමා නොකරන ලද අරමුදල් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් වර්ෂය තුළදී ලැබීම් | වියදම් කල වටිනාකම එකතුව | | | | | ව්‍යාපෘතිය මත අතිරික්තය/ ඌණතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සංවිධානය | වටිනාකම | | සේවක මණ්ඩල | වෙනත් සෘජු | | වෙනත් චක්‍ර | එකතුව | |
| | | | | | වත්කම් | වෙනත් | | | |
| නිවාස<br>ස්ථානය 1<br>ස්ථානය 2<br>වෙනත් | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |
| ධීවර<br>ස්ථානය 1<br>ස්ථානය 2<br>වෙනත් | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |
| වෙනත්<br>ස්ථානය 1<br>ස්ථානය 2<br>වෙනත් | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට මාරු කළා** | | | | | | | | | |
| SFA අනුව | | | | | | | | | |

4.29 ප්‍රාග්ධන බැඳියාවන්

ඒබීසී ශ්‍රී ලංකා ............ දිස්ත්‍රික්කයේ ............ වර්ෂයේදී රු. මිලියන ××× වියදමකින් නිවාස 10ක් තැනීමට බැඳී අතර එයින් රු. මිලියන ××× මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට වියදම් කර ඇත.

4.30 අසම්භාව්‍ය වගකීම්

× ප්‍රදානය කරන්නා විසින් සපයනු ලබන අරමුදල් පදනම් කර ........ වර්ෂයේදී රු. ×× වටිනා උපකරණ නිවාසයකට ලබාදීමට ඒබීසී ශ්‍රී ලංකා බැඳී අතර යම් හෙයකින් මෙම අරමුදල් නොලැබුනහොත් ඒබීසී ශ්‍රී ලංකා හට මෙම පිරිවැය දැරීමට සිදුවනු ඇත.

4.31 සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

ඒබීසී ශ්‍රී ලංකා පී සහ පුත්‍ර සමාගම සමග රු. ××× පරිගණක උපකරණ ලබාදීම සඳහා ගිවිසුමකට එළඹ ඇත. පී සහ පුත්‍ර සමාගමේ අයිතිකරු ඒබීසී සමාගමේ උපදේශකයෙක්ද වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.